# 2025.09.11 දින මහ සභා රැස්වීම
## අලව්ව ප්‍රාදේශීය සභාව

2025.09.11 වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VII වන සැසිවාරයේ පස්වන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා / මන්ත්‍රීතුමියන්ලා**

1. ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
2. ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්. ලක්ෂ්මී කාන්ති ඥාණලතා මැතිනිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. චමින්ද මාල් මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර පතිරණ මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VII වන සැසිවාරයේ පස්වන මහ සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමිය ප්‍රධාන සියලු ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා මා ඉතාමත් ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා. එමෙන්ම, අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය සහ එම නිළධාරීන් සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

**01.2025.08.14 වන දින මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම**

**ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.08.14 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තාව සභා සම්මත කිරීමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජ්. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, 2025.08.14 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ස්ථිර කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ජ්. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම සභා වාර්තාව සම්මත කිරීම මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.08.14 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02.සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**2.1 අභිනව පළාත් පාලන මන්ත්‍රීවරු සහ මන්ත්‍රීවරියන් සඳහා පවත්වනු ලබන විධායක සහතික පත්‍ර පාඨමාලාව - 2025/26**

ප්‍රජාතන්ත්‍රවාදය සහ ආණ්ඩුකරණය පිළිබඳ ආයතනය වෙතින් මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා තේරී පත්වන ලද අභිනව මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් සඳහා පළාත් පාලන ක්‍රමය, ප්‍රාදේශීය ආණ්ඩුකරණය සහ සුපිලිපන්න පාලනය පිළිබඳව විධායක සහතික පත්‍ර පාඨමාලාවක් මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ පැවැත්වීමට සැලසුම් කර ඇත.

2025 සැප්තැම්බර් මස 20 වන සෙනසුරාදා සිට සෑම සෙනසුරාදා දිනකම පෙරවරුවේ පැවැත්වෙන මෙම දේශන මාලාව මාස හයක් පුරා සම්පූර්ණයෙන් නොමිලයේ පැවැත්වෙනු ඇත. සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙන මෙම වැඩසටහනට සමගාමීව දමිළ මාධ්‍ය වැඩසටහනක් සෑම ඉරිදා දිනකම පෙරවරුවේ සංවිධානය කර තිබේ.

ප්‍රජාතන්ත්‍රවාදය සහ ආණ්ඩුකරණය පිළිබඳ ආයතනය (IDAG) විසින් පූර්ණ ශිෂ්‍යත්ව ක්‍රමයක් යටතේ නොමිලේ පවත්වනු ලබන මෙම පාඨමාලාව තුළින් අභිනව පළාත් පාලන සභිකයින් තුළ පළාත් පාලනය සහ ප්‍රජාතාන්ත්‍රික හර පද්ධතීන් පිළිබඳව දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම අපේක්ෂා කරන අතර, නවක මන්ත්‍රීවරුන්ගේ නායකත්වය සහ සන්නිවේදන කුසලතා වැඩිදියුණු කිරීම සඳහා සුවිශේෂී සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කිරීමට සැලසුම් කර ඇති බවත්, මෙම පාඨමාලාව සඳහා සම්බන්ධ වීමට අපේක්ෂා කරන මන්ත්‍රීවරුන් සහ මන්ත්‍රීවරියන් සඳහා වන අයදුම්පත්‍රය මෙම ලිපිය සමඟ Google ලින්ක් ආකාරයෙන් යොමුකර ඇත. එම ලින්ක් එක ඔස්සේ අදාළ මන්ත්‍රීවරුන්ට එම අයදුම්පත්‍රය සම්පූර්ණ කර පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේ හැකියාව පවතී. එමෙන්ම වැඩිදුර තොරතුරු අවශ්‍ය මන්ත්‍රීවරුන්ට info@idag.lk ඊමේල් ලිපිනය වෙත ඊමේල් පණිවුඩයක් යොමුකිරීමෙන් හෝ 0768895096 දුරකථන අංකය වෙත whatsup පණිවුඩයක් යොමු කිරීමෙන් ලබා ගැනීමට හැකියාව ඇති බවසඳහන් කරමින් 2025.08.25 වන දින ප්‍රජාතන්ත්‍රවාදය සහ ආණ්ඩුකරණය පිළිබඳ ආයතනය විසින් ලිපියක් යොමු කර තිබෙනවා.

**2.2 සිව් අවුරුදු සැලැස්ම (2026-2029) සංවර්ධන යෝජනා ලබා ගැනීම**

2026සිට 2029 දක්වා වන සිව් අවුරුදු සැලැස්ම සකස් කිරීමේ කටයුතු සඳහා ගරු මන්ත්‍රීතුමන්ලා සහ තුමියන්ලා විසින් ඉදිරිපත් කරන සංවර්ධන යෝජනා මේ සමඟ යොමුකර ඇති ආකෘති පත්‍රයෙහි සම්පූර්ණ කර 2025.09.30 දිනට පෙර ලබා දීමට කටයුතු කරන්න.

**2.3 පළාත් පාලන සභිකවරියන්ගේ දිස්ත්‍රික් සංසදය පිහිටුවීම**

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය විසින් දිවයිනේ සියළුම දිස්ත්‍රික් ආවරණය වන පරිදි පළාත් පාලන සභිකවරියන්ගේ දිස්ත්‍රික් සංසදය පිහිටුවීම සිදු කරනු ලබන බවත්, එම සංසදයේ විධායක කමිටුව තෝරාපත් කර ගනු ලබන අතර එය සභාපතිනිය, උප සභාපතිනිය, ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරුවලින් සමන්විත බවත්, මීට අදාල කුරුණෑගල දිස්ත්‍රික් නිලවරණය 2025 සැප්තැම්බර් මස ඉදිරි දිනයකදී පැවැත්වෙන අතර ඒ සඳහා සභිකවරියන් සහභාගී කරවන ලෙස ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය විසින් දැනුම් දී ඇති බව දන්වා සිටිමි.

**2.4 මහ හැරුණු මාර්ග පිළිබඳව තොරතුරු ලබා ගැනීම**

අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාව සතු පාරවල් හා පටු මාවත් ලේඛනයේ අත්හැරුණු මාර්ග හා පටු මාවත් පිළිබඳ තොරතුරු ලබාගෙන එම මාර්ග ගැසට් කිරීමට අවශ්‍යව ඇත. එබැවින් කොට්ඨාශයට අදාල ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා තම ප්‍රදේශයේ ගැසට් නොකරන ලද මාර්ග තිබේනම් ඒ පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරන්න.

- 2022-06-13 - පළමුවර ගැසට් කිරීම - මාර්ග 710
- 2024-01-16 - දෙවනිවර ගැසට් කිරීමට මහහැරුණු මාර්ග - 126

**03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම - නැත**

**3.1. නිවාඩු අනුමත කිරීම**

**ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීවරුනි, පහත කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම සඳහා ඉදිරිපත් කරනවා.

**2025.09.11 දින මහ සභාව සඳහා නිවාඩු අනුමත කිරීම - නැත**

**2025.08.26 නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය

**2025.08.26 පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා

**2025.08.27 කාර්මික සේවා කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය

**2025.08.27 මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, ඉහත කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලාගේ හා ගරු මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**

**05. යථා පරිදි කල්දී ඇති යෝජනා**

**(05-1) <u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/05/05/01 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවේ සේවය නියුතු ස්ථිර වෛද්‍ය නිලධාරී ආර්.එම්.ඩී.ජයසේන මහත්මිය, අධ්‍යයන කටයුතු සඳහා 2025.09.0 1සිට 2028.12.31 දින දක්වා විදේශ නිවාඩු ලබා ඇති බැවින්, සේවා කටයුතු පවත්වාගෙන යාමට වෙනත් වෛද්‍ය නිලධාරියෙකු මෙතෙක් ලබා දී නොමැති බැවින්, නිදහස් ආයුර්වේදයේ රාජකාරී කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා දැනට සතියකට දින 02ක් දෛනික ගෙවීම් මත සේවය කරන ආයුර්වේද වෛද්‍ය නිලධාරී ජේ.ඒ.චාමලී මධුෂානි මෙනවිය පූර්ණකාලීනව සේවයේ යොදවා ගැනීමටත්, ඒ සඳහා දෛනික වැටුප් හා දීමනා ගෙවීම් සඳහා අදාල අනුමැතිය ලබා දීම සුදුසු බවටත් යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව සතියකට දින 02ක් දෛනික ගෙවීම් මත සේවය කරන ආයුර්වේද වෛද්‍ය නිලධාරී ජේ.ඒ.චාමලී මධුෂානි මෙනවිය පූර්ණකාලීනව සේවයේ යොදවා ගැනීමටත්, ඒ සඳහා දෛනික වැටුප් හා දීමනා ගෙවීම් සඳහා අදාල අනුමැතිය ලබා දීම සුදුසු බවටත් ඒකමතිකව සභා සම්මත විය.

**(05-02) <u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක අංක 07/05/05/02 දරණ යෝජනාව</u>**

රාජ්‍ය පරිපාලන හා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ උපදෙස් අනුව 2025.09.15 සිට 2025.09.21 දින දක්වා පැවැත්වීමට නියමිත පළාත් පාලන සතිය සඳහා යෝජිත පහත සඳහන් වැඩ සැලැස්ම ක්‍රියාත්මක කිරීමටත්, ඒ සඳහා සභා අරමුදලින් රු. 886,500.00 ක මුදලක් වැය දැරීමටත් ගරු අණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**<u>වියදම් ඇස්තමේන්තුව</u>**
**<u>පළාත් පාලන සතිය - 2025</u>**
**<u>(2025 සැප්තැම්බර් මස 15 සිට 2025 සැප්තැම්බර් මස 21 දින දක්වා)</u>**

| අනුඅංක | පළාත් පාලන ආයතනය | දිනය | | ක්‍රියාත්මකකරනු ලබන වැඩසටහන/ වැඩසටහන් | පවත්වනු ලබන ස්ථානය | ඉලක්කගත ප්‍රජාව/ක්ෂේත්‍ර | ඉලක්කගත සංඛ්‍යාව | සහභාගී කරවාගනුලබන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන | අපේක්ෂිත වියදම (රු:) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2025.09.15 | ජංගම සේවා දිනය | 1.ආයුර්වේද සායනය හා බෝ නොවන රෝග සම්බන්ධ උපදේශනය | නුගවෙලග්‍රාම නිළධාරී කොට්ඨාශය | නුගවෙල ග්‍රාම නිළධාරී කොට්ඨාශ ජනතාව | 200 | අලව්ව ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම්කාර්යාලය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, ගොවිජන සේවා කාර්යාලය, අලව්වපොලිසිය, මයි විෂන් අක්ෂි සායන ආයතනය (පුද්) | 50,000.00 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2.අක්ෂි සායනය හා උපදේශනය | | | | | |
| | | | | 3. රැකියා වෙළඳපොල | | | | | |
| | | | | 4.මහජන ඉල්ලීම් මත මාර්ග මෝටර් ග්‍රේඩර් කිරීම | | | | | |
| | | | | 5.අඩු ආදායම්ලාභී කාන්තාවන් සඳහා ස්වයං රැකියා පුහුණුව හා ව්‍යාපෘතිය නගා සිටුවීමට ආධාර කිරීම | | | | | |
| | | | | 6.ජන හමුව - ග්‍රාමීය ගැටළු හඳුනා ගැනීම හා 2026 වර්ෂය සඳහා සංවර්ධන යෝජනා ලබා ගැනීම | | | | | |
| | | | | 7.සෞඛ්‍ය උපදේශනය හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | | | | | |
| | | | | 8. සභා සේවාවන් හා ගැටළු හඳුනා ගැනීම | | | | | |
| 2 | අලව්වප්‍රාදේශීය සභාව | 2025.09.16 | පරිසර සහ රුක්රෝපණ දිනය | 1.පරිසරය සුරැකීම හා රුක් රෝපණයේ ඇති වැදගත්කම පිළිබඳ පෝස්ටරයක් නිර්මාණය කිරීම (5 ශ්‍රේණිය) | බල ප්‍රදේශ 5 ශ්‍රේණී දරුවන් | 5 ශ්‍රේණී දරුවන් | 500 | අලව්ව ප්‍රාදේශීය සභාව | 10,000.00 |
| | | | | 2.රුක් රෝපණය කිරීමේ වැඩසටහන් යටතේ සුළු අපනයන බෝග,පලතුරු හා වන පැල ආදිය ජල පෝෂිත ප්‍රදේශ, සහා ඉඩම්වල පැෂන් පැල රෝපණය කිරීම හා ජනතාවට ලබාදිම. | බල ප්‍රදේශයේ ගම්මාන | ස්වෙච්ඡා සමිතිසාමාජිකයන්, පරිසර බල කණ්ඩායම | 200 | | 25,000.00 |
| | | | | 3.ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම වැළැක්වීමට සිවිල් සංවිධාන දැනුවත්කිරීම | ග්‍රාමසේවා නිළධාරී කොට්ඨාශය | ගම්වාසීන් | 150 | | 5,000.00 |
| | | | | 4.ගෘහස්ත කොම්පෝස්ට් බඳුන් ප්‍රචලිත කිරීම | ග්‍රාමසේවා නිළධාරී කොට්ඨාශය | ගම්වාසීන් | 5 | | |
| | | | | 5. ඖෂධ පැල රෝපණය කිරීම | බෝයවලපතන ශාලාව හා පූජ්‍යකාල භූමිය | දායක සමාජය | 25 | | ආයුර්වේද පැල තවාන |
| | | | | ගෙවතු වගා පිළිබඳ ගොවි සංවිධාන 64 ක් දැනුවත් කිරීම | ඒකාබද්ධ කොට්ඨාශ 15 | ගොවි සංවිධාන | 50 බැගින් | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 3 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2025.09.17 | සෞඛ්‍ය හා සනීපාරක්ෂණ දිනය | 1.ප්‍රාදේශීයසභාව හා රාජ්‍ය ආයතන , පරිසර සංවිධාන ඒකාබද්ධව අලව්ව නගරය පවිත්‍ර කිරීමේ ශ්‍රමදානය (ප්‍රධාන බස් නැවතුම, අලව්ව සතිපොල සහ කපුවරල ගිමන්හල) | අලව්ව නගරය | අලව්ව නගරයේ වෙළඳ ප්‍රජාව | 50 | අලව්ව ප්‍රාදේශීය සභාව, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය, අලව්ව පොලිසිය | 5,000.00 |
| | | | | 2. කසළ පොල පැවැත්වීම (නොදිරන ද්‍රව්‍ය නිසි ලෙස වර්ග කර වෙන් කිරීම පුරුදු කිරීම , කසළ වලට ආර්ථික වටිනාකමක් ලබා දීම , වැඩිප්‍රමාණයක් ගෙන එන ශිෂ්‍යයින් 10 දෙනෙකුට ත්‍යාග ලබා දීම | රත්නාලංකාරාම හා විද්‍යාලය / වයඹ ජනාධිපති විද්‍යාලය | පාසල් දරුවන් | 2000 | අලව්ව ප්‍රාදේශීය සභාව | 20,000.00 |
| | | | | 3. ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය සමග ඒකාබද්ධව ඩෙංගු මර්දන වැඩසටහන (අලව්ව කුරුණෑගල බස් නැවතුම අවට තණකොල කපා සෝදා පිරිසිදු කිරීම) | අලව්ව කුරුණෑගල බස් නැවතුම | නාගරික ව්‍යාපාර ස්ථාන හා නිවාස | 80 | අලව්ව ප්‍රාදේශීය සභාව, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය, අලව්ව පොලිසි | 5,000.00 |
| | | | | 4. ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සමග සුනඛයන් එන්නත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම | තෝරාගත් ස්ථානය | තෝරාගත් ස්ථානය | 20 | අලව්ව ප්‍රාදේශීය සභාව, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය | |
| | | | | 5. බල ප්‍රදේශයේ තෝරාගත් දහම්පාසල් 10 ක 8,9 ශ්‍රේණි දරුවන් සඳහා පරිසර දැනුම මිනුම තරග 3 ක් පවත්වා තෑගි හා සහතික ලබා දීම | තෝරාගත් දහම්පාසල් | තෝරාගත් දහම්පාසල් | 30 | කුගෙවල ශ්‍රී පුරාණ විහාරස්ථානය, අලව්ව ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 10,000.00 |
| | | | | 6. අලව්ව නගරයේ තේ කඩ, ආපනශාලා , හෝටල්හා බේකරි පරීක්ෂා කිරීමේ වැඩසටහන | අලව්ව නගරය | අලව්ව නගරයේ ව්‍යාපාර | 20 | අලව්ව ප්‍රාදේශීය සභාව, සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය, අලව්ව පොලීසිය | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 4 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2025.09.18 | ආදායම් ප්‍රවර්ධන දිනය | 1.සමාජ මාධ්‍ය හරහා බදු ගෙවන ජනතාව දැනුවත් කිරීම | බල ප්‍රදේශය | අලව්ව නාගරික බල ප්‍රදේශය | 4000 | අලව්ව ප්‍රාදේශීය සභාව | |
| | | | | 2.ජංගම ආදායම් එකතු කිරීමේ වැඩසටහන | අලව්ව ප්‍රධාන කාර්යාල බල ප්‍රදේශය | අලව්ව නාගරික බලප්‍රදේශය | 25 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2,500.00 |
| | | | | 3.අක්කර බදු සමීක්ෂණය | කැප්පිටවලාන උප කාර්යාල බල ප්‍රදේශය | කැප්පිටවලාන බල ප්‍රදේශය | 10 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2,500.00 |
| 5 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2025.09.19 | සාහිත්‍ය, අධ්‍යාපන සහ පුස්තකාල ප්‍රවර්ධන දිනය | 1. පාඨක සමාජ ශක්තිමත් කිරීමේ අරමුණින් පාඨක සමාජ අතර තරඟ පැවැත්වීම (චිත්‍ර, කථික, රචනා, නිසඳැස්) | අලව්ව, බෝයවලාන, මහරඹෑවුල්ල පාඨක සමාජ | පාඨක සමාජය | 1000 | අලව්ව ප්‍රාදේශීය සභාව | 10,000.00 |
| | | | | 2. පුස්තකාල පරිශ්‍ර තුල පොත් ප්‍රදර්ශන පැවැත්වීම | අලව්ව, බෝයවලාන, මහරඹෑවුල්ල පාඨක සමාජ | පාඨක සමාජය | 1000 | | |
| | | | | 3. පෙර පාසල් දරුවන් හා දෙමාපියන් සම්බන්ධ කර ගනිමින් නිර්මාණාත්මක වැඩසටහනක් පැවැත්වීම | පෙරපාසල් දෙමාපිය සංවර්ධන සමිති | දරුවන් හා දෙමාපියන් | 150 | | 3,000.00 |
| | | | | 4. E library ප්‍රවර්ධන වැඩසටහන යටතේ උපකරණ ලබා දීම | අලව්ව මහජන පුස්තකාලය | පුස්තකාල කාර්ය මණ්ඩලය | 4 | | 300,000.00 |
| | | | | 5.පාසල් අතර විවාද තරඟය පැවැත්වීම | බල ප්‍රදේශයේ පාසල් අතර | 11,12,13 වසර සිසුන් | 65 | | |
| 6 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2025.09.20 | මහජන උපයෝගිතා සහ ක්‍රීඩා දිනය | 1.අලව්ව සතිපොල භූමිය සංවර්ධනය කිරීම හා ඉහල මහලයට ගේට්ටුවක් සහ ජංගම වේදිකාවක් සකස් කිරීම | අලව්ව සතිපොල | අලව්ව සතිපොල භාවිතා කරන්නන් | 1250 | අලව්ව ප්‍රාදේශීය සභාව | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | 2.අලව්ව මස් වෙළඳසැල් අසල පදික වේදිකාව සහ කාණුව සකස් කිරීම | අලව්ව නගරය | පරිභෝගිකයින් | 200 | | |
| | | | | 3.අලව්ව නගරයේ වීදි ලාම්පු නඩත්තුව සහ වගකීම් පැවරීම | අලව්ව නගරය | මහජනතාව | 10 | | |
| | | | | 4.සුසානභූමි සුද්ධ පවිත්‍රකිරීමේ ශ්‍රමදාන 14 ක් සිදු කිරීම | අලව්ව බල ප්‍රදේශය | ගම්වාසීන් | 50 | | |
| | | | | 5.අලව්ව මහජන ක්‍රීඩාංගනය සුද්ධපවිත්‍ර කිරීම හා දැල් ආවරණය ගැසීම | අලව්ව නාගරික | ක්‍රීඩකයින් | 25 | | 300,000.00 |
| | | | | 6.කල් ඉකුත් වූ බැනර් කපා ඉවත් කිරීම | අලව්ව නාගරික කොට්ඨාශය | නාගරික ජනතාව | 5 | | 2,500.00 |
| | | | | 7. ගල්දෙණිය නාන තොටුපල පරිශ්‍රය හාමාර්ගය දෙපස කැලෑ කපා පවිත්‍ර කිරීමේ ශ්‍රමදානය (ගල්දෙණි ප්‍රජාමණ්ඩලය ) | ගල්දෙණිය ගම | ගල්දෙණියගම වාසීන් | 50 | | 5,000.00 |
| | | | | 1. ප්‍රජා මණ්ඩල හා අලව්ව ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩලය සමග ඒකබද්ධව සැහැල්ලු පන්දු (සීමිත පන්දුවාර) ක්‍රිකට් තරඟාවලිය | බල ප්‍රදේශයේ ප්‍රජා මණ්ඩල සාමාජික හා කාර්ය මණ්ඩලය | ප්‍රජා මණ්ඩල සාමාජික, මහජන නියෝජිතවරු හා කාර්ය මණ්ඩලය, රාජ්‍ය ආයතන | 15 කණ්ඩායම් | අලව්ව ප්‍රාදේශීය සභාව | 100,000.00 |
| | | | | 2. ප්‍රජා මණ්ඩල, යෞවන සමාජ ක්‍රීඩා සංගම් හා අලව්ව ප්‍රාදේශීය සභා කාර්ය මණ්ඩලය සමග ඒකබද්ධව ශාරීරික සුවතා වැඩසටහනක් පැවැත්වීම | බල ප්‍රදේශයේ ප්‍රජා මණ්ඩල සාමාජික හා කාර්ය මණ්ඩලය | ප්‍රජා මණ්ඩල සාමාජික, මහජන නියෝජිතවරු හාකාර්ය මණ්ඩලය | 150 | අලව්ව ප්‍රාදේශීය සභාව, යෞවන සේවා නිලධාරී කාර්යාලය | 5,000.00 |
| 7 | අලව්ව ප්‍රාදේශීය සභාව | 2025.09.21 | සහතිකපත් ප්‍රදානය හා සමාප්තිය | 3. තිළිණ සහ සහතිකපත් ප්‍රදානය කිරීම | බල ප්‍රදේශයේ තරග වලට ඉදිරිපත්වූවන් | තරග වලට සහභාගී වී ජයගත් පිරිස | 50 | අලව්ව ප්‍රාදේශීය සභාව | 20,000.00 |
| | පළාත් පාලන සතිය වෙනුවෙන් ප්‍රචාරක කටයුතු | | | අලව්ව, බෝයවලාන, මහරච්චිමුල්ල නගර වල බැනර් 03 ක්ප්‍රදර්ශනය කිරීම | | | 3 | අලව්ව ප්‍රාදේශීය සභාව | 6,000.00 |
| | | | | සමාජ මාධ්‍ය භාවිතා කිරීම | | | | | |
| ඇස්තමේන්තු ගත මුළු වියදම | | | | | | | | | 886,500.00 |

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව රාජ්‍ය පරිපාලන හා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ උපදෙස් අනුව 2025.09.15 සිට 2025.09.21 දින දක්වා පැවැත්වීමට නියමිත පළාත් පාලන සතිය සඳහා යෝජිත ඉහත සඳහන් වැඩ සැලැස්ම ක්‍රියාත්මක කිරීමටත්, ඒ සඳහා සභා අරමුදලින් රු.886,500.00 ක (අට ලක්ෂ අසූහය දහස් පන්සියයක) මුදලක් වැය දැරීමටත් ගරු අණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-3) <u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවෙන් කරනු ලබන අංක 07/05/05/03 දරණ යෝජනාව</u>**

2025.08.27 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවෙහි ,අනතුරුදායක ගස් සම්බන්ධයෙන් වූ තීරණ අංක 24ට අනුව, 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 107(2)(1) වගන්තිය ප්‍රකාරව අනතුරුදායක ගස් ඉවත් කිරීම වෙනුවෙන් දරන ලද වියදම් සභාවට අයවිය යුතු ණයක් ලෙස ඒ තැනැත්තාගෙන් අයකර ගනු ලැබිය හැකිය යනුවෙන් සඳහන් බැවින් සහ අනතුරුදායක ගස් සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලද මොහොතේ සිට සභාව මඟින් ඉවත් කිරීම සිදුකරන තෙක් සභාව විසින් වියදමක් දරන බැවින් ඒ වෙනුවෙන් කිසියම් ගාස්තුවක් ගස් කැපුම්කරුවන්ගේ කුලියත් සමඟ අයකිරීම සුදුසු බවට මුදල් කමිටුව වෙත යෝජනාව ඉදිරිපත් කළ අතර, අනතුරුදායක ගස් ඉවත් කිරීම වෙනුවෙන් සභාව මඟින් යම් වියදමක් දරන බැවින් ඒ සඳහා එක් ගසකට රු.1000.00 බැගින් සේවා ගාස්තුවක් හා ගස් කුලියත් සමඟ අය කිරීම සුදුසු බවට කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව, එක් ගසකට රු.1000.00 බැගින් සේවා ගාස්තුවක් කැපුම් කුලිය සමඟ අය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශීය සභාව ස්ථාපිත කරපු කාලයේ සිට දීර්ඝ කාලයක් තිස්සේ අනතුරුදායක ගස් සම්බන්ධයෙන් ඉල්ලීමක් ඉදිරිපත් කළාම සභාවේ කාර්මික නිලධාරී මහත්වරු එම ස්ථානයට ගොස් ස්ථානීය පරීක්ෂණයක් සිදු කරනවා. අවසානයේ ඒ සම්බන්ධයෙන් ලියුම් හත් අට වතාවක් ඉදිරිපත් වෙනවා. අපි ඒකට ගොඩාක් මුහුණ දීලා තියනවා. අතුකෝරාල මන්ත්‍රීතුමාගේ ගමේ රාජ්‍ය නිලධාරී කෙනෙක්ගේ නිවසක් ළඟ ගහක් තිබුණා. අතුකෝරාල මන්ත්‍රීතුමාටත් ඒකට මැදිහත් වෙන්න බැරි වුණා. අවසානයේ මම ඒකට මැදිහත් වෙලා ඒ ගහ කැප්පෙව්වා. සභාව නිසා තමා ගහ කපන්න වුණේ නැත්නම් ඒ ගහ නිසා පවුලම ඉවරයි. ඒ නිසා මෙවැනි කටයුතුවලදී රු. 1000.00ක මුදල සුළු මුදල් ප්‍රමාණයක් වුණත් මේක අය කිරීම සඳහා ගෙනාපු යෝජනාව මම ස්ථිර කරනවා. හේතුව, කවුරු මේ සභාවේ සභාපති වුණත් මෙම ප්‍රශ්න පත්‍රයට මුහුණ දෙන්න සිදුවෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජී. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධව මටත් යමක් කියන්න තියනවා. වයසක අම්මා කෙනෙක් හිටියා එතුමිය අනතුරුදායක ගසක් පිළිබඳව සභාවට ඉදිරිපත් කළා දහ වතාවක් විතර සභාවට ඇවිත් මේ පිළිබඳව සොයාබැලුවා. ගහ කපන්න ප්‍රතිපාදන නැහැ කීවා. ග්‍රාම නිලධාරී මහතා සමඟ සාකච්ඡා කරලා අපි මුදල් යොදවලා ගහ කපලා අයින් කළා. අපි යම් මුදලක් අය කරනවා නම්, එම ගහ අයිති කෙනාට එම මුදල ගෙවීමට නොහැකි තත්වයේ ආර්ථික අපහසුතා පවතී නම්, ඒ ගැනත් අවධානය යොමු කළ යුතුයි. සභාවක් හැටියට අපි මහජනතාවට සේවය කළ යුතුයි. ආර්ථික අපහසුතා තිබේ නම්, එම අනතුරුදායක ගස කඩා වැටෙනතුරු කල් මරන්නැතුව ඒ ගස ඉවත් කර දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, නාරද මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ කාරණය සම්බන්ධයෙන් පනත ප්‍රකාරව ක්‍රියාත්මක කිරීමට නොහැකි වුණත්, එය ක්‍රියාත්මක කරන්න පුළුවන් ක්‍රමයක් ඇති. ගම් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී මහතා විසින් අඩු ආදායම්ලාභී පුද්ගලයෙක් බවට සහතික කරමින් ඒ පිළිබඳව අදාල කාරක සභා වෙත යොමු කර ගරු මහ සභාවට ඉදිරිපත් කර අපි සියල්ලන්ගේම ඒකමතික තීන්දුවක් ගත්තොත් හොඳයි කියලා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, සභාවට වැඩිපුරම ඉල්ලීම් ඉදිරිපත් වෙන්නේ අනතුරුදායක ගස් සම්බන්ධයෙන්.
මේ පිළිබඳව සොයා බැලුවොත් ප්‍රධාන කාරණය අල්ලපු ගෙවල් දෙක රණ්ඩු වුණත් ඒ ප්‍රශ්නය සමඟ සභාවට අරන් එනවා. එක් පුද්ගලයෙක් වැට මායිමේ තිබෙන ගහක් කපන්න කියලා ඉල්ලීමක් කළොත් ඊට එහා ගෙදර පුද්ගලයාත් මේ ගස් ටික කපන්න කියලා සභාවට ඉල්ලීම් කරනවා. ඒ තුළින්

ජනතාව අතරම වැරදි අවබෝධයක් ඇති කර ගන්නවා. අල්ලපු ගෙදරට අනතුරුදායක වන ගහක් තියනවා නම් සහයෝගයෙන් කතා කරලා ඒක අයින් කර ගන්න අපිටත් සංස්කෘතියක් තියෙන්න ඕනි. එහා ගෙදර අයට අල්ලපු ගෙදර ගහ අවහිරයක් නම් ඒක සභාවට යොමු කළාම ඒක සභාවෙන් ඉවත් කරලා දෙනවා කියලා ජනතාව අතර මතයක් තියනවා. නමුත් ඔවුන් මේකේ අවසාන ක්‍රියාවලිය දන් නැහැ. අනතුරුදායක ගහක් කපන්න සභාවෙන් අය කිරීමක් සිදු කරන බව මහජනතාව දැනුවත් නැහැ. යොමු කිරීම් වැඩිවීමට හේතුව ඒකයි. මෙම අනතුරුදායක ගස් සම්බන්ධයෙන් පැමිණිලි ගොඩාක් ඉදිරිපත් වෙනවා, නමුත් ස්ථානීය පරීක්ෂණය සිදු කිරීම සඳහා තාක්ෂණික නිලධාරී මහත්වරුන් ඉන්නේ දෙදෙනයි. ගරු මන්ත්‍රීවරු ප්‍රකාශ කළා වගේ, සභාවෙන් ගහ කපන්න යනකොට එම අනතුරුදායක ගහ වැටිලා, වෙන්න ඕනි විනාශයත් වෙලා තියෙන්න පුළුවන්. මෙම යෝජනාව ඉදිරිපත් කළේ ප්‍රායෝගිකව මුහුණ දෙන තත්වයකුත් සමඟයි. අවංකවම එන පුද්ගලයාට ගැටලුවක් නැහැ අල්ලපු ගෙදරත් එක්ක තරහ නිසාත් ගැටලු ඉදිරිපත් කරනවා. ඒ අනුව මෙම යෝජනාව හරහා පැමිණිලි ප්‍රමාණය අඩු කරගන්න හැකි වෙයි කියලා හිතනවා. අපි මේ අයුරින් ඉදිරියට කරගෙන යමු . යම් අවස්ථාවක කෙනෙක්ට ආර්ථික අපහසුතාවයන් පැමිණියහොත් අදාල ග්‍රාම නිලධාරී මඟින් අඩු ආදායම්ලාභී බවට තහවුරු කරගනිමින් මහසභා තීරණයක් හරහා දුප්පත් කෙනෙකුට අවස්ථාවක් දෙන්න බැරිකමක් නැහැ. අපි එහෙම ක්‍රියාත්මක කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී ඔබතුමා ප්‍රකාශ කළ කරුණු සමඟ එකඟ වෙනවා. විශේෂයෙන්ම ගැටලු තැන්වලදී මොහාන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වගේ පනත ප්‍රකාරව කටයුතු කළ යුතුයි. ඒවගේම සභාවෙන් අනතුරුදායක ගස් කපයි කියලා මිනිසුන්ගේ අදහසක් තියනවා. තව ලොකු ප්‍රශ්නයක් තියනවා. සමහර අවස්ථාවල රු.1000.00 ට කපනවාද කියලා හිතෙනවා. ලේකම්තුමියනි, ගසක් කපන විට මෙපමණ මුදලක් අය වෙනවා කියලා නිලධාරීන් හරහා දැනුවත් කරන්න ඕනි. නැත්නම් වැඩි මුදලක් කියන්න ඕනි. ඒ නිසා ප්‍රශ්න වෙන එකත් අඩු වෙනවා, නැත්නම් ගරු සභාපතිතුමාගේත්, නිලධාරීන්ගේත් කාලය අපතේ යාමක් සහ ප්‍රශ්න වැඩි වෙන එකයි සිදුවෙන්නේ. හැම මෙහොතකම ප්‍රශ්න වැඩි වෙන්නේ නොදැනුවත්කම නිසයි. මුලින්ම දෙපාර්ශවයම කැඳවලා පහදලා දෙනවානම් ලොකු විසඳුමක් වෙයි. නීත්‍යානුකූලව සභාව මැදිහත් වෙලා ගහ කපනවා නමුත් ගහ අයිතිකාරයාට හැකි නම් ගහ කපා ගන්න ඒක වඩාත් හොඳයි කියලා මම හිතනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා, මූලික අවස්ථාවේදී අපේ නිලධාරීන් ස්ථානීය පරීක්ෂණයට ගිහාම, අනතුරුදායක ගස කපන්න ගස් අයිතිකරුට රු. 5000.00 ක් වැය වෙනවා නම්, සභාවෙන් කළොත් ඒවගේ දෙගුණයක් අයකර ගන්න සිදුවෙන බව පවසමින් ඔවුන්ව දැනුවත් කරන්න කියලා නිලධාරීන්ට උපදෙස් දීලා තියෙන්නේ. ඇත්ත කාරණයත් ඒකමයි. ගස කපන්න භාර දෙන්නෙත් ටෙන්ඩර් කරලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් මට අත්දැකීමක් තියනවා. අපේ ගමේ ප්‍රශ්නයක් වුණා. පරිසර සහ පොදු පහසුකම් කමිටුවේදීත් මේ පිළිබඳව කතා කළා. මේ ප්‍රශ්නය සභාවට ඉදිරිපත් කරන්න තරම්ම ගෙවල් දෙක තරහයි. මම ගස් අයිතිකාරයාට කීවා සභාවෙන් එයි නමුත් ගහ කපන්න රු.10000.00 ක් විතර යනවා කියලා. පහුවදාම ඒ පුද්ගලයා ගහ කැපුවා. අතුකෝරාල මන්ත්‍රීතුමා සඳහන් කළා වගේ දෙපාර්ශවයම සහභාගී කරගෙන, ගසක් කපන්න සභාවෙන් කොපමණ මුදලක් අය කර ගන්නවාද, ගස් කැපුම් කුලිය රු. 3000.00 ට වැඩි වන බවත් ඊට අමතරව ගසකට රු.1000.00 බැගින් මුළු මුදල රු.4000.00ක් පමණ අයකරන ගන්න සිදුවෙන බවත් ඔවුන්ව දැනුවත් කළ යුතුයි. එතකොට ඒ පුද්ගලයා ඔහු විසින්ම ලාභෙට කරගන්න තැනට පත් වෙනවා. ඒ නිසා පනතේ ප්‍රකාරවම ඒ විදිහටම කරමු.

ඒ අනුව අනතුරුදායක ගස් ඉවත් කිරීම වෙනුවෙන් සභාව මඟින් යම් වියදමක් දරන බැවින්, ඒ සඳහා එක් ගසකට රු.1000.00 බැගින් සේවා ගාස්තුවක් කැපුම් කුලිය සමඟ අයකිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-4) ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/05/05/04 දරණ යෝජනාව**

අලව්ව ප්‍රාදේශීය සභාවට නව ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස මෙන්ම සේවාවක් ලෙස ආදාහනාගාරයක් ඉදිකර ගැනීම කාලෝචිත වන අතර, ඒ සඳහා පරමාඋල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දවටගොල්ල සුසාන භූමි ඉඩම යොදා ගැනීමත්, මේ සඳහා අප සභාව සතුව මූල්‍ය ප්‍රතිපාදන නොමැති බැවින්, දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබාගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමටත් මෙම සැලසුම් හා ඇස්තමේන්තු සකස්කර ගැනීමට ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙන් සේවය ලබා ගැනීමටත් හා ඊට අදාල ගෙවීම් කටයුතු සිදු කිරීමත් සුදුසු බවට යෝජනා කරමි

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මෙම ආදාහනාගාර සම්බන්ධයෙන් ඉදිරිපත් කරන්න තියන කරුණ තමයි. ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ලෙස ප්‍රියන්ත මහතා කටයුතු කරපු කාලසීමාවේදී ඇස්තමේන්තු කැදෙව්වා. එතන හාර කෝටි ගාණක් පමණ වුණා. නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසරය ඇතිව හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා වෙත ආදාහනාගාරයක් ඉදි කිරීම සම්බන්ධව ඉදිරිපත් කළා. එම අවස්ථාවේදී නාගරික සංවර්ධන අධිකාරියට වෙන් කරන මුදලින් මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යොමු කිරීම සඳහා තීරණය කළා. මේක ක්‍රියාත්මක කිරීමට පෙර දැන් තියන සුසාන භූමියේ දෙකෙන් පංගුවට වැඩි කොටසක් පෙහොර නිෂ්පාදනාගාරයටයි පාලර් එකටයි වෙන්කරා. දැව හෙලීමේ වනාන්තරයක් ලෙස තමා මෙම කොස් කැලේ තියෙන්නේ. පාර්ලිමේන්තු මන්ත්‍රී පී.බී.වැත්තෑව මැතිතුමාගේ කාලයේ දැව හෙලීමේ වනාන්තර අත්පත් කර ගැනීමේ පදනම මත ෆැක්ටරියක් හදන්න මිරිහෙලිය සුසාන භූමි කොටස සුද්ද කළා. ඒ කාලයේ තිබුණ දේශපාලන පසුබිමත් සමඟ ඒක නතර වුණා. අපිට මේකෙන් අක්කරයක් ලබා දෙන්න කියලා හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා හරහා එවකට කටයුතු කළ විෂය භාර අමාත්‍ය පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනිය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළා. ඒවගේම මරණය තියා ගන්නවත් ඉඩ පහසුකමක් නැති අසරණ මිනිසුන් සඳහා පාලර් එකක් ඉදිකිරීමටත්, සභාවට ආදායමක් ලැබෙනවා වගේම මිනිසුන්ට සේවයක් සැපයෙන නිසා අක්කරයක භූමියක් ඉල්ලීමට හේතුවන බවට එතුමියට තවදුරටත් ප්‍රකාශ කළා. ඒ අනුව, මෙම ඉඩම දැඩි රක්ෂිත වනාන්තරයක් නොවන දැව හෙලීමේ වනාන්තරයකට අයිති නිසා මේකෙන් අක්කරයක භූමියක් ලබා දීමට හැකියාව පවතින බව සඳහන් කරමින් ගරු විෂය භාර අමාත්‍ය පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනිය පොරොන්දුවක් ලබා දුන්නා. එතෙන්ට එනකල් මෙම කාර්යය නතරවෙලා තියෙන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, සභාවට යාබදව තිබෙන රක්ෂිතයෙන් අක්කරයක භූමි ප්‍රමාණයක් ලබා ගන්න කටයුතු කරන්න. අපි ඩිපෝව සමඟත් සාකච්ඡා කළා. ඩිපෝවෙහි ළිඳ තියෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් ඩිපෝවත් අතරයි. නමුත් ඊට පිටුපසින් සුසාන භූමියේ අක්කරයක් තිබේ නම්, ඩිපෝ එකට පිටුපස කොටසක් දීලා ඩිපෝ එකට අයිති ළිඳ තියෙන ස්ථානයෙන් පාලර් එකක් හදන්න අක්කර භාගයක කොටසක් ගන්න පුළුවන්. ඒ ගැන ඔබතුමා අවධානය යොමු කරන්න. ඔබතුමාට මතක ඇති මෙම යෝජනාව සම්බන්ධයෙන් සභාවේ ගරු මන්ත්‍රී මණ්ඩලය ඒකමතිකව එකඟ වෙලා ඉදිරියට කටයුතු කරගෙන ගියේ, ඒ පිළිබඳව හැන්සාඩ්වලත් සඳහන් වෙලා ඇති. ඒ නිසා ඒ ටිකත් සමඟම ක්‍රියාත්මක වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ආදාහනාගාරයක් ඉදිකරන්න යෝජනා කරපු ස්ථානය පිළිබඳව මම දන්නැහැ, නමුත් ආදාහනාගාරයකට ලොකු ඉඩක් අවශ්‍යයි. ආරක්ෂාවක් ඕනි, වාහන දාන්න තැනක් අවශ්‍යයි.

අනිත් කාරණය, අපි ගන්න ණය ප්‍රමාණය මත අපිට ආදායමක් උපයන්න හැකියාවක් පවතීද යන්න පිළිබඳව සැලකිලිමත් විය යුතුයි. සමහර ආදාහනාගාරවල අකටයුතුකම් වෙන බව අපි දන්නවා. ආදාහනාගාරයක් ඉදි කිරීම සඳහා එදා කෝටි තුන හතරක් වෙන් කරා නම්, අද ඊට වඩා දෙගුණයක් පමණ මුදලක් වෙන් කරන්න සිදුවෙනවා. මම පළමුවෙන් යෝජනා කළේ හුම්බුළුව වගේ ලොකු ඉඩමක් තියෙන භූමියේ තැනක් ඒවගේම මඩවලත් අක්කර දෙකක වගේ ප්‍රමාණයක් තියනවා. නමුත් මෙම යෝජනා කරපු ස්ථානයේ ඉඩකඩ පවතී නම් හොඳයි. අනිත් කාරණය තමා, මීරිගම, වරකාපොල, පොල්ගහවෙල සහ නාරම්මල යන ස්ථාන අවට ආදාහනාගාර තියෙනවා. බෝපිටියෙත් ආදාහනාගාරයක් තියනවා. ඒනිසා අලව්ව බල ප්‍රදේශයේ මැදකට ආදාහනාගාරයක් ඉදි කරනවා නම් හොඳයි. මේ හරහා සභාවට ආදායමක් උපයා ගන්න පුළුවන් වගේම, ජනතාවට කඩිනම් සේවාවක් පහසුවෙන් ලබා දෙන්නේ කෙසේද යන්න සොයා බලමින් ඉදිරි කටයුතු සිදු කරමුයි කියන ඉල්ලීම කරනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා, අපි ප්‍රථමයෙන්ම තාක්ෂණික නිලධාරී මහත්වරු සමඟ ස්ථානීය පරීක්ෂණයක් සිදුකළා. ඉදිරි කටයුතු සිදුකරන්නේ එම ස්ථානීය පරීක්ෂණයේ අනුමැතියත් සමඟයි. මම දන්නවා යොදවන ධනයත් සමඟ අවුරුදු දෙකකින්, තුනකින්, හතරකින්, පහකින් ලාභ ලබන්න බැහැ. අපි ගණන් හදලා තියෙන්නේ. නමුත් මම මෙතනදී මූලික අරමුණ බවට පත් කර ගන්නේ අපේ බල ප්‍රදේශයට නැති සේවාවක් ලබා දීමටයි. වසම් හැට හයෙන් තිස් ගාණක්ම ආදාහනාගාර කටයුතු සඳහා වෙනත් තැන්වලට යන්නේ. වියදම ලොකු වුණත්, අනාගත පරම්පරාවට මේක ලොකු ඉතුරුවක් වෙයි. ලාභ ලබන කාලයක් එයි. ඒත් සමඟම පාලර් එකේ කටයුත්තත් ඒ ස්ථානයේම කරගන්න පුළුවන් වටපිටාවක් තියනවා. නමුත් මෙම යෝජනාව ඉදිරිපත් කරන් නැත්තේ, ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කරගෙන නොමැති නිසයි. එම යෝජනාව ඉදිරිපත් කරන්නේ ඒ සඳහා කොපමණ මුදලක් අවශ්‍යද යන්න සොයා බලමින් අදාල දැනුවත් වීම මතයි. මේක අවසන් වූ විට පාලර් එකක් සම්බන්ධයෙන් යෝජනාව තියනවා. ඒ නිසා පැමිණෙන ගැටළු සාකච්ඡා කරමින් හොඳම දේ ඉදිරියට කරගෙන යමුයි කියන ඉල්ලීමත් සමඟ මෙම යෝජනාව ස්ථිර කරමු.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවට නව ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස මෙන්ම සේවාවක් ලෙස ආදාහනාගාරයක් ඉදිකර ගැනීම කාලෝචිත වන අතර, ඒ සඳහා පරමාඋල්ල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි දවටගොල්ල සුසාන භූමි ඉඩම යොදා ගැනීමත්, මේ සඳහා අප සභාව සතුව මූල්‍ය ප්‍රතිපාදන නොමැති බැවින්, දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබාගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමටත් මෙම සැලසුම් හා ඇස්තමේන්තු සකස්කර ගැනීමට ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙන් සේවය ලබා ගැනීමටත් හා ඊට අදාල ගෙවීම් කටයුතු සිදු කිරීමත් සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-5) <u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/05/05/05 දරණ යෝජනාව</u>**

2026 වර්ෂය සඳහා බදු හා බලපත්‍ර ගාස්තු පැනවීමේ නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2026 වර්ෂය සඳහා බදු හා බලපත්‍ර ගාස්තු පැනවීමේ නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>යථා පරිදි කල් දී නොමැති යෝජනා</u>**

**(05-6) <u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/05/05/06 දරණ යෝජනාව</u>**

2025.08.26 දින අලව්ව ප්‍රාදේශීය සභාව සතු වාහනවල ඉන්ධන පරීක්ෂාව යාන්ත්‍රික ඉංජිනේරු මහතාගේ පරීක්ෂාව යටතේ සිදු කරන ලදී. ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වෙන අතර එම තොරතුරු පිළිගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**01.ඉන්ධන පරීක්ෂාව සිදු කරන ලද වාහන පිළිබඳ තොරතුරු**

| අනු අංකය | වාහනයේ අංකය | වාහනයේ නම | කිලෝමීටරයකට /පැයකට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය |
|---|---|---|---|
| 1 | PF-7468 | කැබ් රථය | 9 L |
| 2 | PC-0366 | කැබ් රථය | 10 L |
| 3 | 52-8668 | කැබ් රථය | 9 L |
| 4 | LE-7413 | බොලෙරෝ ලොරි රථය | 10 L |
| 5 | RD-1601 | ටැෆේ 45 ට්‍රැක්ටරය | 2.5 පැය |
| 6 | ZA-5298 | මෝටර් ග්‍රේඩරය | 9L |

| | | | |
|---|---|---|---|
| 7 | LM-5623 | ගාබේජ් කම්පැක්ටරය | 3 L |
| 8 | LL-7772 | කෘෂ කැබ් රථය | 7 L |
| 9 | RB-3571 | ටැෆේ 5900 ට්‍රැක්ටරය | 3පැය |
| 10 | 37-5160 | ෆෝඩ් ට්‍රැක්ටරය | 3පැය |

**02.ඉන්ධන පරික්ෂාව සිදු නොකරන ලද වාහන පිළිබඳ තොරතුරු**

| අනු අංකය | වාහනයේ අංකය | වාහනයේ නම | ඉන්ධන පරික්ෂාව සිදු නොකිරීමට හේතුව |
|---|---|---|---|
| 1 | ZA-5067 | බැකෝ ලෝඩරය | ඇක්ස්ලේටරය කැඩී යාම නිසා නොහැකි විය |
| 2 | LL-6946 | ටිපර් රථය | අවශ්‍ය ධාවන කාලය සපුරා නොමැත |
| 3 | RD-9440 | ට්‍රැක්ටරය | අලුත්වැඩියා කටයුතු සිදු වෙමින් පවතී |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2025.08.26 දින අලව්ව ප්‍රාදේශීය සභාව සතු වාහනවල ඉන්ධන පරික්ෂාව යාන්ත්‍රික ඉංජිනේරු මහතාගේ පරික්ෂාව යටතේ සිදු කරන ලද අතර, ඒ පිළිබඳ ඉහත සඳහන් තොරතුරු පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-7)** **<u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/05/05/07 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාව සඳහා ද්‍රව්‍ය ප්‍රතිසාධනයට මධ්‍යස්ථානයක් (MRF) ඉදිකිරීමට අදාලව ලංසු ඇගයීම් කමිටු සාමාජිකයින් පත්කර දෙන ලෙස ඉල්ලීම් කළ අතර, ඒ අනුව පළාත් පාලන කොමසාරිස්ගේ අංක වපපදෙ/04/03/02/04 හා 2025.09.04 දිනැති ලිපියෙන් පහත පරිදි කමිටු සභාපති හා කමිටු සාමාජිකයන් නම්කර එවා ඇති අතර ,ඒ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| නිලධාරි | සේවා ආයතනය |
|---|---|
| ජේ.එම්.එස්.අයි.බණ්ඩාර මහතා (කමිටු සභාපති) - පළාත් පාලන ඉංජිනේරු | පළාත් පාළන දෙපාර්තමේන්තුව |
| එස්.එන්.බී.ඩබ්.එම්.ඩී.ජී.වඩිනමුණ මහතා (කමිටු සාමාජික) -නිර්මාණ වැඩ අධිකාරී | පළාත් පාළන දෙපාර්තමේන්තුව |
| ඩබ්.එම්.එල්.සී.විජේසූරිය මහතා (කමිටු සාමාජික) - විමර්ශන නිලධාරී | පළාත් පාළන දෙපාර්තමේන්තුව |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාව සඳහා ද්‍රව්‍ය ප්‍රතිසාධනයට මධ්‍යස්ථානයක් (MRF) ඉදිකිරීමට අදාලව පළාත් පාලන කොමසාරිස්ගේ අංක වපපදෙ/04/03/02/04 හා 2025.09.04 දිනැති ලිපියෙන් ලංසු ඇගයීම් කමිටු සාමාජිකයින් ලෙස ඉහත පරිදි කමිටු සභාපති හා කමිටු සාමාජිකයන් නම්කර එවා ඇති අතර ,එම නිලධාරීන් මෙම ව්‍යාපෘතියට අදාලව ලංසු ඇගයීම් කමිටු සාමාජිකයින් ලෙස පත් කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-8) <u>ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/05/05/08 දරණ යෝජනාව</u>**

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - වාර්ෂික සංවර්ධන සැලැස්ම (වෙනත් පළාත් පාලන සේවා)- 2025- ප්‍රතිපාදන ලබා දීමට අදාලව, ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ NWP/CM/PL/01/06/2025 හා 2025.09.04 දිනැති ලිපියට අනුව අලව්ව ප්‍රාදේශීය සභාව වෙත පහත වැඩ විෂයන් සඳහා ප්‍රතිපාදන අනුමත කර ඇති අතර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| වැඩ විෂය | ලබාදෙන ප්‍රතිපාදන (රු. ශත) | විස්තරය |
|---|---|---|
| අලව්ව සතිපොළ ගොඩනැගිල්ල සඳහා කොටසක් එකතුකිරිම | 6,000,000.00 | පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රසම්පාදන කටයුතු සිදුකරනු ඇත. |
| වාහන නැවතුම් මධ්‍යස්ථානයේ භූමිය කොන්ක්‍රීට් කිරීම. | 750,000.00 | අලව්ව උතුර වසමට අයත් සමිතියක් මඟින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා |

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - වාර්ෂික සංවර්ධන සැලැස්ම (වෙනත් පළාත් පාලන සේවා) -2025 ප්‍රතිපාදන ලබා දීමට අදාලව, ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ NWP/CM/PL/01/06/2025 හා 2025.09.04 දිනැති ලිපියට අනුව අලව්ව ප්‍රාදේශීය සභාව වෙත ඉහත වැඩ විෂයන් සඳහා ප්‍රතිපාදන අනුමත කර ඇති අතර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>06.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම</u>**

**(6.1) <u>2025.08.26 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.08.26 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, 2025.08.26 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ෂය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.08.26 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(6.2)<u>2025.08.26 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.08.26 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, 2025.08.26 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ෂය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.08.26 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා රැස්වීම් වාර්තාව සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(6.3)<u>2025.08.27 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.08.27 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, 2025.08.27 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.08.27 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(6.4) <u>2025.08.27 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.08.27 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, 2025.08.27 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.08.27 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(6.5) <u>2025.08.06 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.08.06 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, 2025.08.06 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.08.06 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(6.6) <u>2025.09.04 දින පැවති ප්‍රසම්පාදන කමිටු රුැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
2025.09.04 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, 2025.09.04 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව, 2025.09.04 දින පැවති ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.**

**(07.1) 2025 අගෝස්තු මාසය ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පූරෝකථන වාර්තාව**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 අගෝස්තු මාසය ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පූරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 අගෝස්තු මාසය ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පූරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 අගෝස්තු මාසය ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පූරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(07.2) 2025 අගෝස්තු මාසය ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පූරෝකථන වාර්තාව**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 අගෝස්තු මාසය ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පූරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**
ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 අගෝස්තු මාසය ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පූරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 අගෝස්තු මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පූරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**08.** **වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි , මෙම න්‍යාය පත්‍රය සභාවෙන් අපිට එනවා. න්‍යාය පත්‍රයේ කරුණු ඉදිරිපත් කරද්දී ඒ අතර මැද්දෙන් යෝජනාවක් එනවා. අපිට මේක හොයා ගන්න බැහැ. මන්ත්‍රීවරු මේ කොළ ඔක්කොම අදිනවා. ඔබතුමා යෝජනාව කියාගෙන යනවා, අපිට අදහසක්වත් ප්‍රකාශ කරන්න කාලයක් නැහැ. ඉල්ලීම එනවා අපි යෝජනාව තව හොයනවා. ඒ නිසා න්‍යාය පත්‍රයේ හරියට සඳහන් කරලා එවන්න.න්‍යාය පත්‍රය අපිට යොමු කරාට පස්සේ ඔබතුමාට යෝජනා ඉදිරිපත් වෙනවා නම් කරුණාකරලා වෙනම ඒ ටික වෙනම කොළේක සඳහන් කරලා එවන්න. ඔබතුමාගේ පොළේ යෝජනාවට ලක්ෂ හැටක් සම්මත වෙලා ඇවිත් තියනවා. ඔබතුමා ඒ යෝජනාව ඉදිරිපත් කරනවා. ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කරන්නවත් අපිට කාලයක් නැහැ. එමනිසා ක්‍රමාණුකූලව සිදුකරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා,තුමියන්ලා ඔබතුමාලට න්‍යාය පත්‍රය එව්වට පස්සේ ඉදිරිපත් වුණු කරුණු, මේවා කල් දී නොමැති යෝජනා. අද විතරක් නෙමේ ඊට කලින් ඕනම සභාවක උනා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එතකොට සදාචාරය කෝ?

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, මෙතන සදාචාරය පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. ඔබතුමාලට න්‍යාය පත්‍රය එව්වට පස්සේ නම් මේ යෝජනා එන්නේ. මම වගකිම ගන්නම් මේ සභාවේ වාඩිවෙනකොට මේ න්‍යාය පත්‍රයේ නැති ඒවා බෙදලා දෙන්න. කිසිම ප්‍රශ්නයක් නැහැ මම වගකීම ගන්නවා.

හිතාමතා මෙම යෝජනා පස්සේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනවා නෙමේ . අපි හැම විටම උත්සාහ ගන්නේ නිසිවේලාවකට 26 දෙනාටම හරියටම න්‍යාය පත්‍රය එවන්න. ඒ සඳහා කාර්ය මණ්ඩලය ලොකු වෙහෙසක් ගන්නවා. ඒවගේම දින වකවානුවලට අදාලව තමා කටයුතු කරන්නේ. එහෙම කියලා කාර්යාලයීය රාජකාරි කටයුතු ආදී සියලු දේවල් විධිමත්ව ගලාගෙන යනවානේ. අද මහසභාවට යොමු කරලා අනුමැතිය ගන්න ඕන එකක් තියෙනවා නම් ලබන මාසයේ මහසභාව එනකල් ඉන්න බැහැනේ. ඒ නිසා තමයි ඊට පස්සේ ආපු යෝජනා විදිහට සභාවට ඉදිරිපත් කරන්නේ. නමුත් අඩුපාඩුවක් වෙලා තියෙනවා, ඒකේ වගකීම මම ගන්නවා නැවත ඒ දෙය වෙන් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, කාර්ය මණ්ඩලය හරියට මහන්සිවෙනවා කියලා මෙම සභාව ජීවිතයටම පටන්ගත්තු පළමු වතාව නොවේ. අඩුපාඩු නැතිව අපිට පහසු අන්දමින් අදහස් ප්‍රකාශ කළ හැකි පරිදි සභා වාර්තා ලැබෙන්න සළස්වන්න කියලා ඉල්ලා සිටිනවා. ඔබතුමා ඉදිරිපත් කරනවා උපසභාපතිතුමිය ස්ථිර කරනවා වචනයක්වත් කතා කරන්න අපට අවස්ථාවක් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, තවත් කරුණක් ඉදිරිපත් කරන්න තියනවා. මේ සභාව පැවැත්වුයේ පස් වෙනි වතාවටයි. සභා වාර පහේම සභා වාර්තා තව වෙනකල් ලියාපදිංචි තැපැලෙන් අවේ නැහැ. මේවා හරි වේලාවට දින හතරකට පෙර ලැබෙනවා, ඒත් සභා වාර පහේම වාහනෙන් ඇවිත් තමා වාර්තා ලැබුණේ. මෙම වියදම් අපරාදේ. මේ කැබ් එකක් ආසනය වටේම දුවනවා. හැම මන්ත්‍රීවරයෙක්ගේ ගෙදරටම සභා වාර්තාව බෙදනවා . එතකොට වියදම වැඩියි. මම නාරම්මල සභාවේ කටයුතු කළා මේ සභාවේ කටයුතු කළා හැබැයි හැමදාම සභා වාර්තාව ලියාපදිංචි තැපැලෙන් ආවා. එතකොට මේ සභාවේ විතරක් සභා වාර්තා ලියාපදිංචි තැපැලෙන් එවන්න බැරි ඇයි?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ පොළේ පියස්ස පිළිබඳ යෝජනාව මටත් හොයා ගන්න බැරි වුණා. මොකක්ද ඒකෙන් කරන්නේ? ඒකේ විනිවිදභාවය අපිට දැනගන්න අවශ්‍යයි. සමහර වෙළෙන්දෝ කියනවා යම් යම් පාර්ශවයන්ට වාසිවෙන විදිහට කටයුතු කරනවා කියලා. අපිට මේ සම්බන්ධව විවාදයක් අවශ්‍යයි. මොකද සමහර මිනිස්සු මේකෙන් වාසි ගන්න බලාපොරොත්තු වෙනවා. ඒවා කරන්න දෙන්න බැහැ, අපි මහජන නියෝජිතයෝ. අපි විසිහය දෙනාම සභා බල ප්‍රදේශයට වගකියන්න ඕනි. එක් කෙනෙකුට වාසි වෙන්නත්, තවත් කෙනෙකුට අවාසි වෙන්නත් කිසි කෙනෙකුට අසාධාරණයක් වෙන්නත් අපි ඉඩ දෙන් නැහැ. ඒ නිසා විසිහය දෙනාගෙම සභාවක් මේක, ඔබතුමා අපිට වගකියලා බැහැ අපි මහජනතාවට වග කියන්න ඕනි. මේ මිනිස්සුන්ගේ ඡන්ද අරන් ඇවිල්ලා තියෙන්නේ නිකම් විහිලු කරලා නෙවේ. ඒ නිසා යත්තල්ගොඩ මන්ත්‍රීතුමා කීවා වගේ අනිවාර්යෙන්ම කලින් මේක ලැබෙන්න ඕනි. විනිවිදභාවයකින් යන්න ඕනි, අපිට සමහර දේවල් විශ්වාස නැහැ. ඒක අපිට දැන් පෙනී යනවා ඒක නිසා මේ පිළිබඳ විවාදයක් අවශ්‍යයි. වෙළෙන්දෝ කියනවා අපිව පිටිපස්සට දාන්න හදනවා කියලා නොයෙක් චෝදනා තියනවා. අපි ඒවා නිර්භීතව කතා කරන්න ඕනි. මොකද අපි කාගෙන්වත් වාසි අරගෙනත් නැහැ ගන්නෙත් නැහැ. අපි හරිදේ කරන්නේ. අපි කවදාවත් හොරකම් කරලා නැහැ. රජයේ මුදල් අවභාවිතා කරලා නැහැ. ගෙවල්වලට ගහලා නැහැ.ගෙවල් ගිනිතියලා නැහැ, හරිම අවංක ජීවිතයක් ගත කරන්නේ. කවදාවත් හතුරෝ කියලා අය නැහැ. අපි දේශපාලනය ගෙනිච්චේ එහෙමයි. මන්ත්‍රීවරු කරදරයක නම් අපි උදව් කරනවා. අපිට ලිඛිතව පැහැදිළිව පිළිවෙලකට අවශ්‍යයි. මේක රාජ්‍ය ආයතනයක්. හොරාට හොරා කියන්න බයත් නැහැ.ජේනවනේ දේශපාලඥයෝ හිරේ යනවා හොරු අල්ලලා හිරේ දානවා එම නිසා ලිඛිතව අපට අවශ්‍යයි. හරි විදිහට වැඩේ කරන්න ඕනි. දේශපාලනයට ඇවිල්ලා හොරකම් කරන්න බලාපොරොත්තුවක් නැහැ. මම 2011 ප්‍රාදේශිය සභාවට ආවේ. පොළ ඉදිකරද්දී අපිට බලය තිබ්බා. අපිට ඕනි නම්, පොළේ කඩයක් දාගන්න තිබ්බා. කවදාවත් අපි ඒවා කරන්නේ නැහැ. අපි දේශපාලනයට එන්නේ විනෝදාස්වාදයක් විදිහට මිනිස්සුන්ට උදව් කරන්න. අපි දේශපාලනයට ආවේ, හොරකම් කරන්නවත්, පවුලේ අයට උදව් කරන්නවත් නෙවේ. මන් හිතනවා කවුරුත් එහෙම නැතුව ඇති කියලා. අපි සදාචාර සම්පන්නයි. අපි කවදාවත් වංචාවට, දූෂණයට, යටින් ගැහිලිවලට අපි උදව් කරන්නේ නැහැ කියලා ප්‍රකාශ කරන්න කැමැතියි. ලේකම්තුමියනි, විනිවිදභාවය ඉතාම අවශ්‍යයි. අපි කටයුතු කරන්නේ එහෙමයි. ඉදිරි අනාගතයේදීත් එහෙමයි.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු සමන්ත යත්තල්ගොඩ මන්ත්‍රීතුමා මතු කරා සභා වාර්තාව වාහනෙන් ගිහිල්ලා බෙදනවා කියලා ගරු මන්ත්‍රීතුමා, ඇත්තටම වාහනෙන් ගිහිල්ලා බෙදන්නේ දහතුන් දෙනෙකුට විතරයි. අපේ දහතුන් දෙනාගේ ඒවා කිසිම ගෙදරකට ගෙනියන්නේ නැහැ.

කාර්යාලයට ගිහිල්ලා ගන්න තියෙන්නේ. ඔබතුමන්ලාට ඒක වාහනෙන් යවන්නේ නිසි වේලාවට ලබා දෙන්න ඕනි නිසයි. වියදමක් දරනවා තමයි, හැබැයි 2018 මාත් සභාවේ හිටියා සන්ධ්‍යා කුමාර සභාපතිතුමාගේ කාලයේත් හැමදාම සභා වාර්තාව ගෙදරට ඇවිල්ලා තමයි දුන්නේ. මම අමුණෝවිටවත්තේ ඉන්න කාලයේ පාරෙනුත් ගොඩක් ඈත, එදා ඉඳලා එතෙන්ට වාහනෙන් ඇවිල්ලා තමා සභා වාර්තාව බෙදුවේ. ඔබතුමන්ලාට ලියාපදිංචි තැපෑලෙන් එවන්න කියනවා නම්, ඒක එවන්නම්. ඒක ගැටලුවක් නැහැ. ඒක පහසුව තකා ගන්න ක්‍රමයක් මෙතෙක් අපේ කිසිම කෙනෙක්ගේ ගෙදරට ගිහින් බෙදුවේ නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඔබතුමාට උත්තර දෙනවා නෙවේ. නමුත් මම පසුගිය සභා වාරවල හිටියේ නැහැ. හිටපු සන්ධ්‍යා කුමාර සභාපතිතුමා සභා වාර්තා වාහනෙන් ගෙදරට ගිහින් දුන්නද කියන එක දන්නේ නැහැ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, ඒ හින්දා කරා කියනවා නෙවේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඔබතුමා දක්වන කරුණුවල රීති ප්‍රශ්නයක් තියනවා. ඔබතුමාගේ මන්ත්‍රීවරුන්ට ඔබතුමන්ලා සභා වාර්තා කාර්යාලයේ තිබ්බහම දින ගණනට පෙර ගන්නවද නැද්ද කියලා දන්නේ කොහොමද?

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, අපි ඒකට වැඩ පිළිවෙලක් හදාගෙන තියනවා. නියමිත දිනට ලබා දෙන්න. අනික ඒක එයාලා මතු කරන්න ඕනි කාරණාවක්. ඒ අයත් එක්ක ගණුදෙනුව හදාගෙන තියනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, යම් අවස්ථාවක ඔබතුමාටත් වරදින්න පුළුවන්. අපි වියදම් පැත්ත උපරිම අඩු කරන්නනේ බලන්නේ. සභා වාර්තාවක් මෙහෙම වාහනවලින් බෙදද්දි මුදල් විශාල ප්‍රමාණයක් වැයවෙනවා. නියමිත ක්‍රමවේදයට අනුව සිදුකරා නම් ගැටලුවක් නැහැ කියන එක ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අරුණ මන්ත්‍රීතුමා කියපු පොළේ ප්‍රශ්නයට මටත් අදහසක් තියනවා. පොළේ මිනිස්සුන්ගෙන් ඇහුවා, පොළේ ප්‍රශ්නය ලොකුවටම තියනවා. ඔබතුමාගේ ඥාති කොටස ඉස්සරහට ගේන්න හදනවා කියලා, ඔබතුමාට එක එල්ලේම චෝදනාව එල්ලවෙනවා, එකේ ඇත්ත තත්වය මම දන්නේ නැහැ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා, අපි මේ සම්බන්ධව වෙනම සාකච්ඡාවක් හෝ විවාදයක් හරි කරමු. අද මෙතන හෝ වෙනම දිනයක් දාගෙන හරි, ඒක ප්‍රශ්නයක් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ සංකල්පය අනුව පියස්ස ඉදිරියට ගේන එක හොඳයි. නමුත් එතනදී තව කොටසකට අසාධාරණයක් වෙනවා. ඒ පොළේ දැනට ඉන්න කට්ටියට යෝජනාවක් තියෙනවා. ඒ පියස්ස එහෙම්ම ම තේවත්ත පාරට යනකල් දික් කරලා ඉස්සරහ වාහන නැවතුම්පොළට නැතුව පොළේ ඒ තියන හැඬේටම ගන්න කියලා. ඒක යෝජනාවක් විදිහට ගේනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, පියවරෙන් පියවර තාක්ෂණික ප්‍රශ්න සියල්ලම කතා කරමු. කිසි ගැටළුවක් නැහැ. ඒක කතා කරන්න ඕනි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒකේ ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, ලොකු ප්‍රශ්නය තියෙන්නේ දැන් නෙමේ. කලින් ඕක ලොකු ප්‍රශ්නයකට ගිය හින්දා තමයි විසඳන්න ඇවිල්ලා තියෙන්නේ.

පෞද්ගලිකව ඔය පොළ ඔහොම තියෙන එක තමා මට තියෙන පෞද්ගලික ලාභය. මගේ ස්ථානය හොඳම තැනක තියෙන්නේ, ඒක ගත්තේ ඉල්ලලා නෙමේනේ. දැන් පොළේ අනිත් සියලු ස්ථාන ඔක්කොම ඉල්ලලා ගත්ත ඒවා. මේ සම්බන්ධව අදාල නිලධාරින් ගෙන්නලා කොහොමද මේ පොළේ කඩ ගියේ, කඩ දෙකක් තිබ්බ කෙනාට කඩ තුනක්, කඩ අටක් වුනේ කොහොමද?, කඩ තිබ්බ නැති විදියේ හිටපු අයට කඩවල් දෙකක් හම්බවෙලා තියෙන්නේ, හිටපු මන්ත්‍රීවරුන්ට කොහොමද හම්බවුනේ කියලා අහන්නම්. හිටපු මන්ත්‍රීවරු එදා පොළේ හිටපු තැන් ඊට අදාල සැලැස්ම පරණ පොළේ එක, දෙක, තුන කියලා හිටපු සියලු දෙනාගේම නම් සහිත ලේඛනයක් මම ළග තියනවා. ඒ නිසා අසාධාරණය වුනේ දැන් ඉන්න අයට නෙමේ. මම දැන් කරන යෝජනා ඇතුලේ අසාධාරණකම් කරපු අයට අසාධාරණයක් කරන්නෙත් නැහැ. පොළ ඉස්සර තිබුණේ මංතීරු හතරකට ඇතුලු වුනාම පාරිභෝගිකයා කෙළවරටම යනවා, ඒකනේ සාධාරණ. දැන් හදලා බෙදපු ක්‍රමයට පාරිභෝගිකයා බඩු ගන්න පොළ වටේම යන්න ඕනි. පාරිභෝගිකයා පොළේ ඉදිරි පෙලෙන් බඩු අරගෙන යනවා, පොළේ ඇතුළේ ඉන්න වෙළෙන්දාට ලොකු අසාධාරණයක් වෙනවා. අද මම කරන්නේ පොඩි කොටසක් ඉදිරියට ගෙනල්ලා පොළ තිබ්බ විදිහට මංතීරු හතර හදලා දැන් ඉන්න අය කවුරුත් වෙනස් කරන්නෙත් නැහැ. ඔහොම්මම අනිත් පැත්තට හැරෙන්න කියනවා. දැන් ඉන්න විදිහ වැරදියි. ඒක තමා චෝදනාව. පොළේ ඉස්සරහ ඉන්න අයට කඩ තිබ්බේ නැහැ. පේමන්ට් එකේ හිටියේ. පැවති දේශපාලන නායකත්වයට මෙතන දෙන්න කියලා පෙන්නලා පේමන්ට් එකේ හිටපු අය කඩ ගත්තා. මම ළග ඔක්කොම විස්තර තියනවා. එදා හිටපු තැන් අද සිටින තැන් පිළිබඳ සැලස්මක් තියනවා. මම ඒවා තමයි ඉහළට ඉදිරිපත් කරලා වෙනස්කර ගත්තේ. ඒ කියන්නේ කෝටි ගාණක් වියදම් කරලා පොළක් හැදුවට එළියේ ටෙන්ට් ඇදගෙන ඉටිරෙදි ගහගෙන ඉන්නවානම් වැඩක් නැහැනේ. ඒ අයත් ඇතුළට එන්න ඕනි. දැන් එහා පැත්තේ ටෙන්ට් දාගෙන ආපහු පාරේ බඩු විකුණනවා. මෙච්චර කෝටි ගාණක් වියදම් කරලා ගොඩනැගිල්ලක් හදලා ඒකේ කඩ කාමරයකට වර්ග අඩි තිස්පහක ප්‍රමාණයක් දුන්නේ, බඩු දාලා එලා ගන්නවත් බැහැ. නමුත් ඊට වඩා ප්‍රමාණයක් දෙන්න තිබුණා. කඩ විස්සකටත් වැඩිය හොරට අරගෙන තියනවා. මම පියවරෙන් පියවර ඒවා දීපු විදිහයි, සාකච්ඡා කරපු විදිහයි,පාට් දාපුවයි කොහොමද බෙදුවේ කියන දේවල් සියල්ලම සම්බන්ධව ලිඛිත දේවල් තියාගෙන තමයි මේකට ප්‍රවේශ වෙලා තියෙන්නේ. මට පාඩුයි දැන් ඔය තියෙන තැන වෙනස් කළොත් මොකද ඉස්සරහට යනකොට නෙමේ වෙළඳාම් තියෙන්නේ. පරණ පොළ තියෙන කාලයේ තොග වෙළෙන්දෝ පොළ පිටුපස හිටියේ. තොග බඩු විකුණලා ඉවර වුණාම තමයි ඉදිරිපස ඒවා විකිණෙන්නේ. මිනිස්සු යන තැනින්ම බඩු ගන් නැහැ. යනම තැනම මම හිටියේ. ඒකනේ ප්‍රශ්නේ තියෙන්නේ. පොළේ ඉන්න ඕනි හරි තැන අපි දන්නවා. අද මගේ බිස්නස් එක තියන තැන හොඳම තැන. ඒක මට නැතිවෙනවා. මම කවදාවත් දේශපාලනයේදී සතපහක දෙයක් වෙනුවෙන් ප්‍රතිපත්ති පාවලා දීලා නැහැ. ඕනම කෙනෙක් මූණට ඕනිම දෙයක් ඔප්පු කරන්න. මට පොළේ කඩ අවශ්‍ය නම් මේ තැන ඕන කියලා පෙන්නලා ගන්නවා. පරණ පොළ වෙනුවෙන් තාවකාලික පොළ හදලා තිබ්බා මෙහි හිටපු නිලධාරින් පෙට්ටියක තුණ්ඩු ටික දාලා අපිට ගන්න කිව්වා. මාත් අනිත් අය වගේ තුණ්ඩුවක් ගත්තා. එම අවස්ථාවේදීත් පළමු වැනි කඩේ මට වැටිලා තිබ්බේ. මම කවදාවත් කඩ බෙදෙන කොට එක එක්කෙනාට සල්ලි දීලා මෙතන දෙන්න කියලා කීවේ නැහැ. දැන් මන්ත්‍රීතුමාලට ඕනි වෙලාවක මගෙන් අයථා දෙයක් වෙලා තියෙනවා නම් මගෙන් අහන්න මම කැමැතියි මුහුණ දෙන්න. මම ඉතිහාසයේ ඉඳලා එහෙම දේවල් කරලා නැහැ. හෙට කරන්නෙත් නැහැ. අදත් සද්භාවයෙන් කරන්නේ, කරලා අවසන් වුණාම තමා මිනිස්සු තේරුම් ගන්නේ මේ මනුස්සයා වැරද්දක් කරලා නැහැ කියලා. දැන් හොරට කඩ ගත්ත අය බයයි. ඒ පිරිස කරපු වැරදි මම භාර ගන්නෙත් නැහැ. මංතීරු හතරට පරණ පොළ තිබ්බ ආකාරයට පාරිභෝගිකයා පොළෙහි කෙරවලටම බඩු ගන්න යනවා. සමහර මුදලාලිලා පිටුපස බලාගෙන ඉන්නේ. එහෙම සැලැස්මක් පොළේ තිබ්බේ නැහැ. ඒ සැලැස්ම විධිමත්ව හදාගන්න අවශ්‍යයි. කඩ කාමරවල ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන නිසා, ඉදිරියට ගන්න ඕනි. කඩ වැඩි වෙන නිසා ලොකුවට ගන්නැහැ. යම් ප්‍රමාණයක් ඉදිරියට අරගෙන මංතීරු හතරට පොළ පිහිටුවන්න හදන්නේ. මම ඕන දේකට මුහුණ දෙන්න ලෑස්ති මිනිහෙක්. මම කවදාවත් මට මෙතන දෙන්න කියලා මෙච්චර කාලයකට කියලා නැහැ. කීප අවස්ථාවක් පොළ කඩලා හැදුවත් මම එහෙම කියලා නැහැ එහෙම ගත්ත අය තමා ඉන්නේ. එහෙම ගත්ත අය පාට් දාපු තැනුයි, සාකච්ඡා තිබ්බ තැනුයි මම අදාල වේලාවට කියන්නම්. භය වෙන්න එපා මම කිසිදු වැරද්දක් කරලා නැහැ වැරදි කරපු මිනිස්සු භය වෙලා ඉන්නේ අයථා විදිහට ගත්තු කඩ මම ගනී කියලා. හිටපු මන්ත්‍රීතුමාට කඩයක් තිබ්බද? නම කියන්නේ නැහැ කවුද කියලා. එයා පේමන්ට් එකේ හිටියේ. පොළ බෙදනකොට එයාට කඩවල් දෙකක් හම්බ වුණා. පරණ පොළේ එයා පේමන්ට් එකේ හිටපු තැන ත්‍රිකෝණේ මම ලකුණු කරලා අහවල් කඩේ මෙයාගේ කියලා සැලැස්මේ තියනවා. එයා කඩ දෙකක් අරගෙන අනිත් මිනිස්සු වර්ග අඩි තිස්පහක ඉන්නවා. එයා එළියටත් අරගෙන අද කඩ හතරක ප්‍රමාණයක් භුක්ති විඳිනවා. එයා පොළ බෙදනවට දැන් කැමති නැහැනේ. එයා විතරක් නෙවේ ඒ පේළියම පොළ බෙදනවට කැමති නැහැ.

අපි එතනින් බඩු ගත්තා ආපසු ආවා. එයාලට අනිත් පැත්ත හැරෙන්න විතරයි තියෙන්නේ. එතකොට කෙරවලේ ඉන්න වෙළෙන්දටත් සාධාරණයක් තියනවා. ගරු මන්ත්‍රීතුමන්ලා අපි මෙතන කතා කරමු මම ලියකියවිලි අරගෙන එන්නම් කිසි ගැටළුවක් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, න්‍යාය පත්‍රය සම්බන්ධව ප්‍රශ්නයක් මතු වුණා. ඇත්තටම මාත් ඒක පිළිගන්නවා. න්‍යාය පත්‍රය සම්බන්ධව සෑම කෙනාම දැනුවත් වෙලා ඉන්න ඕනි. ගැටළුවක් තියේ නම් ඒ සම්බන්ධව ඉදිරිපත් කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, සභාව ආරම්භ කරන මොහොතේ ජාතික කොඩිය ඔසවලා ජාතික ගීය වාදනය කරනවා මීට පෙර සභාවෙත් අඩුපාඩුවක් දැක්කා. ජාතික ගීය වාදනය කරද්දි ගිය සභාවාරයේ දී ශබ්ද විකාශන යන්ත්‍රය ක්‍රියා විරහිත වුණා අද ශබ්ද විකාශන යන්ත්‍රය වාදනය කරද්දී වෙන සිංදුවක් වාදනය වුණා. පෙරවරු 9.30 ට නම් සභාව ආරම්භ කරන්නේ, ඊට පෙර එය ක්‍රමානුකූලව ක්‍රියාත්මක වෙනවද පරික්ෂා කර බලා ඒ වේලාවට නිවැරදිව වාදනය කරන්න සලස්වන්න. ඒ පිළිබදව අවධානය යොමු කරන්න කියලා නිලධාරි මණ්ඩලයෙන් ඉල්ලනවා. ඒවගේම අපට න්‍යාය පත්‍රය හම්බවෙන අවස්ථාවේ යත්තල්ගොඩ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා ඒක ලියාපදිංචි තැපැලෙන් යොමු කරනවා නම් හොඳයි කියලා. අපේ ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරුන්ගේ සභා වාර්තාව කාර්යාලයේ තියනවා ඒක නියමිත වේලාවට ගන්නවා කියන එකේ තහවුරුව අපිට තියනවා. ඒකට අපි නිසි වැඩපිළිවෙලක් හදලා තියනවා. අපි සියලු දෙනාම වියදම් අවම කරන එක ගැන තමා කතා කරන්නේ. න්‍යාය පත්‍රය අපි කාර්යාලයෙන් ලබා ගන්නකොට චමින්ද වර්ණසූරිය මන්ත්‍රීතුමාගේ න්‍යාය පත්‍රය අපේ නිවසට පොඩ්ඩක් එහාට ගිහිල්ලා දීලා යනවා. ඔක්කොම ළගට එහෙම තමා යන්නේ. අපේ නිවස එහා පැත්තේ කෙනාට වාහනයෙන් ඇවිත් දීලා යනවා අපි කාර්යාලයට ඇවිත් අරන් යනවා. ඒ නිසා වියදම් අඩු කරගන්න නම්, ලියාපදිංචි තැපැලෙන් යොමු කරන එක පහසු සහ වියදම අවම නම් ඒ සඳහා කාලසීමාව තියාගෙන ක්‍රියාත්මක වුණා නම් හොඳයි කියලා හිතනවා. අනිත් එක තමා අරුණ මන්ත්‍රීතුමා කීවා විනිවිදභාවයෙන් කරන්න ඕනි කියලා. ඇත්ත සංවර්ධන වෙවා හැම දේකදීම විනිවිදභාවයකින් අපි කටයුතු කරන්නේ. ඇස්තමේන්තුවේ සිට සියලුම දේවල් ගමේ මිනිස්සුන්ට දීලා පෙන්නලා තමා විනිවිදභාවයෙන් කටයුතු කරන්නේ. අපේ සියලු දෙනාටම ලාභ ඉපැයීමේ බලාපොරොත්තුවක් නැහැ. අපිට අවශ්‍යතාවය සභාවට සේවයක් ලබා දෙන්න පුළුවන් ප්‍රාදේශිය සභාවක් පිහිටුවන එකයි. ඒ එක්කම ජනතාව සතුටුවන ආකාරයේ සේවයක් ලබා දීමයි. අලව්ව ප්‍රාදේශිය සභාවෙන් හොඳ සේවයක් ඉටු කරනවා කියලා ජනතාවගෙන් ඒ වචන ටික ඇහෙන තැනට ප්‍රාදේශිය සභාව වැඩ කළොත් අපි සියලු දෙනාටම ආඩම්බර වෙන්න පුළුවනි. අනිත් කාරණය පොළේ ප්‍රශ්නය. ගරු සභාපතිතුමනි, කළින් තිබු පොළේ මංතිරු ගණන මට මතක නැහැ. ඉස්සර අපි පාරෙන්ම ඇවිල්ලා ඇතුල් වුණාම පොළ වටේම ඇවිත් එළවළු ටික අරගෙන එනවා. නමුත් දැන් පොළ ඇතුළට ගිහාම සමහර විට මැද ඉන්න වෙළෙදුන්ගේ බඩු ටික බලාගෙන ගියාම මෙහා පැත්තේ ඒවා බලන්න අපි ආපහු එන්න වෙනවා. ඇත්තටම පොළ ඇතුළේ ප්‍රශ්නයක් තියනවා. මිනිස්සුන්ට කාලය කළමනාකරණය කරගෙන ජීවත් වෙනකොට එළවළු අරගෙන කරවල ගන්න වෙන තැනකට යන්න වෙනවා. ඊට පස්සේ නොතේරුණ එළවළු ගන්න මේ රවුමෙන් ගිහිල්ලා ආයේ අනිත් රවුමෙන් යන්න වෙනවා. පෙර තිබ්බ විදිහ ක්‍රමානුකූලයි. ඔබතුමා කීවා වගේ අයථා ලෙස කඩ කාමර අරන් තියෙනවා නම්, එක් කෙනෙකුට එක කඩ කාමරයක් වෙනුවට කඩ කාමර අටක් අරන් තියනවා නම්, එතන ලොකු අසාධාරණයක් තියෙනවා. මේ පොළේ කඩ කාමරයක් අරන් ආදායම් මාර්ගයක් හදාගන්න අවශ්‍ය පුද්ගලයෝ මේ බල ප්‍රදේශයේ ඉන්නවා. අනිවාර්යෙන් මේ පිළිබදව සොයා බැලිය යුතුයි. ඔබතුමාට යෝජනාවක් කරනවා අනිවාර්යෙන් ඒ සම්බන්ධව පරික්ෂණයක් කරලා අසාධාරණයට ලක් වුණ පුද්ගලයන් සිටී නම් ඒ අයට සාධාරණයක් ඉෂ්ඨ කළ යුතුමයි. ඒ වගේම පොළේ තිබෙන ක්‍රමය නිවැරදි විය යුතුයි. මිනිසුන්ට අවශ්‍යතාවය තියෙන්නේ ඔවුන්ගේ පහසුවයි. අපි හදන්නේ පාරිභෝගියාට හොඳ සේවයක් ලබා දීමටයි. ඒ නිසා හොඳ සේවයක් පාරිභෝගිකයාට ලබා දෙන විදිහට පොළක් නිර්මාණය විය යුතුයි. පොළේ කොපමණ බඩු තිබ්බත් ලාභෙට බඩු තිබ්බත් ඒ මනුස්සයාට වැඩි වේලාවක් එතන ගත කරන්න වෙනවා නම් ඒ පුද්ගලයාට මොනතරම් බඩු තිබ්බත් වැඩක් නැහැ. ඒ මනුස්සයාට හරියට සේවයක් ලබා දෙන්නට නම් ක්‍රමානුකූලව පොළ නිර්මාණය විය යුතුයි. හොඳ පොළක් නිර්මාණය වීම තුළින් හොඳ සේවයක් ලබා දිය හැකියි. ඒ නිසා මම ඉල්ලා සිටිනවා විවාදයක් තියලා හරි විනිවිදභාවයකින් හැම කෙනෙකුටම සාධාරණයක් වන විදිහට සල්ලි බලය, දේශපාලන බලය, මැර බලය තියෙන්න පුළුවන්, ඒ කිසිදේකට අපි යට වියයුතු නැහැ. මහජනතාව වෙනුවෙන් සේවය කරන්න අවශ්‍යතාවය තියෙන්න ඕනි. අපි මහජන ඡන්දයෙන් තමා මෙතෙන්ට ආවේ. මහජනතාවගේ ප්‍රශ්න නියෝජනය කරන්න ,ඒ ගොල්ලන්ගේ ප්‍රශ්න කතා කරන්න , අවශ්‍ය පහසුකම් සපයලා දෙන්න කටයුතු කිරීම තමා අපේ මූලික අරමුණ වෙන්න ඕන.

ඒ නිසා එම සේවාව ලබා දෙන්න නම්, අනිවාර්යෙන්ම විනිවිදභාවයකින් යුතුව කටයුතු කළ යුතුයි කියලා මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා. ඒ වගේම අපි සභිකයෝ විදිහට මෙතෙන්ට ඇවිල්ලා ඉන්නේ අපේ ගරුත්වය ආරක්ෂා කරගෙන සභාවේ ගරුත්වය ආරක්ෂා වෙන විදිහට වැඩ කරන්න. ඒ සඳහා අපි වැඩ කටයුතු කරමුයි කියලා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඇත්තටම යත්තල්ගොඩ මන්ත්‍රීතුමා කතා කරපු කාරණයේදී වියදම් පැත්ත ගත්තහම එකේ සාධාරණයක් තියනවා. නිලධාරීන්ගේ පැත්තෙන් මම දෙයක් මතු කරන්න කැමැතියි. මම ආයතනයක ප්‍රධානියෙක් ලෙස කටයුතු කළ අවස්ථාවේදී නිලධාරින් සම්බන්ධයෙන් අත්දැකීම් තියනවා. අන්තිම මොහොතේදී නිලධාරින් යෝජනා ගොනු කරනවා. සමහර වේලාවට රෑ හතට අට වෙනකල් සභා වාර්තාව හදනවා. ඒක තමයි ප්‍රායෝගික පැත්ත. ඒ නිසා දෙපැත්තෙම කරුණු සාකච්ඡා කළ යුතුයි. ඊළඟට දවස් හතකට කලින් න්‍යාය පත්‍රය යොමු කළ යුතුයි කියන රීති ප්‍රශ්නය එනවා. ඒ සඳහා කාර්ය මණ්ඩලය වැඩි කරමින් මේ කටයුත්ත විධිමත්ව සිදු කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකසා ලියාපදිංචි තැපැලෙන් යවන්න. එහෙම නැත්නම් මන්ත්‍රීවරු සියලු දෙනාගේම කැමැත්ත පරිදි වාහනයෙන් හරි වෙන විදිහකින් හරි සභා වාර්තාව ලැබීමට සලස්වන්න අවශ්‍යයි. නිලධාරින් පැත්තෙන් ඔබට තියෙන ගැටළුවක් වෙන්න ඇති. අද ඉඳලා ගත්තහම සභාවට දවස් හතකට විතර කලින් අන්තිම කමිටුව තියෙන්නේ ඊළඟ සතියේ හෝ මේ සතිය වගේ කමිටු වාර්තා ලබා ගන්න ඕනි. මම මේ පරිපාලනමය ගැටළුවක් පෙන්නන්නේ. සභා වාර්තාව සකස් කරන්න සතියක් එක හමාරක්වත් නිලධාරීන්ට යනවා. ඒ වගේ ඒ කරුණු නිවැරදි විය යුතුයි. අන්තිම කාලයේදී යෝජනා ඇතුළත් වෙන්න ඕනි. නමුත් යත්තල්ගොඩ මන්ත්‍රීතුමා කීවා වගේ වියදම් අඩු කිරීම සම්බන්ධව විපක්ෂයේ කණ්ඩායම එකම මතයක එක හෙලාම ඉන්නවා. අපිට පෙනෙන සාධාරණ දේ කීවේ. නිලධාරින්ගේ, සභාපතිතුමාගේ සහ මන්ත්‍රී මණ්ඩලයේ මධ්‍යස්ථ තැනක ඉඳලා මම මේ කතා කරන්නේ, මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු සියලු දෙනාගේම අවධානය යොමු කරවන ලෙස ප්‍රකාශ කරනවා. හරි දේ හරි වැරදි දේ වැරදි මගේ පෞද්ගලික මතය එයයි. අපිට කතා කරන්න පුළුවන් වැඩ කරන් යද්දි තමා අඩුපාඩු පෙනෙන්නේ. ඒ නිසා ඒ සම්බන්ධව සුදුසු ක්‍රමයක් යොදවන ලෙස ඉල්ලා සිටිනවා. ඊළඟ කාරණය පොළ සම්බන්ධ කාරණය. පොළ ඉදි කරද්දී ප්‍රථමයෙන්ම විරුද්ධ වුණේ ගරු සභාපතිතුමා ඔබතුමා. එහෙම නේද ගරු සභාපතිතුමා ?

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, මම එදා විරුද්ධ වුණා ඒක හරියටම හරි. හැදුවේ පොළක් නෙවේනේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අපි හරිදේට හරි කියනවා වැරදි දේට වැරදි කියනවා අපේ කොන්දත් තියෙනවා. එතකොට පොළ සම්බන්ධයෙන් ගෙනාපු පළමුවෙනි අවස්ථාවේදී දැඩි විරෝධය මත ප්‍රතිපාදන ආපසු යනවා. ගරු සභාපතිතුමා මන්ත්‍රීවරයකු ලෙස හිටපු කාලයේ ඔබතුමා සමඟ 90% ක්ම පොළේ කණ්ඩායම හිටියා. දැන් ඉන්නවද දන් නැහැ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
දැන් 90% ක් ම නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මම අලව්වේ කෙනෙක් නිසා මට ඒ සියළු තොරතුරු එනවා. දෙවෙනි පාර පොළ සම්බන්ධව සභාවේ තීන්දු තීරණ ගනිද්දි ඔබතුමන්ලා විරුද්ධ වුණා. අන්තිමට අපි තීන්දුවක් ගත්තා. අලව්වට එන ප්‍රතිපාදන අලව්වේ රඳවා ගන්න අවශ්‍ය නිසා අපි අනුමැතිය දුන්නා. එදත් අපි ජනතාව පැත්තේ හිටියේ අදත් එහෙමයි. ඒ නිසා අපි දෙන්නට නම් පක්ෂ පාට නැහැ. ගරු සභාපතිතුමනි, මේ කාරණයක් විතරක් නෙමේ උදාහරණයක් ගත්තහම මම රීති සම්බන්ධව දුන්න ලිපිය ඔබතුමාට න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න බැරිවෙලා. මගේ කිසිදු වෛරයක් තරහක් නැහැ. මාසයක් යනකල් පිළිතුරු නැහැ. කොමසාරිස්තුමා වෙත යොමු කරන්න පුළුවන්. අපි එතෙන්ට යන් නැහැ. අපිට ලැජ්ජයි. මොකද අපේ සභාවේ සභාපතිතුමා අපි විවේචනය කරනවා කියලා. අපි හිතන්නේ එහෙමයි. ඔබතුමා කොහොම හිතනවද දන්නේ නැහැ. ඒ සම්බන්ධව නැවත නැවතත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒවගේ පොළ සම්බන්ධව ගත්තහම මේතාක් ඔබතුමා වංචා දූෂණවලට සම්බන්ධ වෙනවා දැකලා නැහැ. ඒක හදවතින්ම කියනවා. මම ඔබතුමාට යෝජනා කරන්නේ පොළේ ඉන්න කණ්ඩායම සමඟ මන්ත්‍රී මණ්ඩලයට සාකච්ඡාවක් ලබාදෙන්න කියලා. එතකොට සම්පූර්ණයෙන්ම මේක පිරිසිදුයි අයථා ලෙස කඩ කාමර ගත්තා නම් නොයෙකුත් අක්‍රමිකතා කරල තියනවානම් අපිට කතා කරන්න පුළුවන්.

අපි දන්න දේවල් කියන්නේ නැහැ, පසුගිය මැතිවරණ කාලයේ නොයෙකුත් කතන්දර එළියට ආවා ඒවා මෙතන කියලා මම පහත් ආසාවන් සංසිදුවා ගන්නා පුද්ගලයෙකු නොවේ. මම සම්පූර්ණ විස්තර දන්නවා මට මනුස්සකම තියනවා දේශපාලනය වෙනම වුණත් ගරු සභාපතිතුමා මාත් සමඟ පොඩිකාලේ ඉදලා හිතවත්. නමුත් සභාපතිතුමාගේ භූමිකාවේදී මෙතන ඔබතුමා ගරු සභාපතිතුමා. එළියෙදි මිත්‍රයෙක් ලෙස ආමන්ත්‍රණය කළත්, අපි එතුමාට ගරු කරලා මහජන ඡන්දයෙන් පත් වූ සභාපතිවරයෙක් ලෙස ඔබතුමාගේ කර්තව්‍ය කරගෙන යාමට සහයෝගය ලබා දෙනවා. මේ පොළේ ප්‍රශ්නේදී ඍජුව, සාධාරණව කටයුතු කරනවා නම් පක්ෂයේ දහතුන්දෙනා නැතත් විපක්ෂයේ දහතුන් දෙනා ඔබ සමඟ ඉන්නවා. පසුගිය මාස තුනේදී අපි ඔප්පු කරලා තියනවා. අපි ඔබතුමාගේ කකුලෙන් ඇදලා නැහැ. සමහර අවස්ථාවල අපිව බිත්තියට හේත්තු කරලා මැටි ගහන තත්වයක් ආවත් හෙට දවසේ අලව්ව වෙනුවෙන් ඔබතුමා ගන්න නිවැරදි ඍජු තීන්දු සමඟ විපක්ෂයේ දහතුන්දෙනා එකට ඉන්නවා. පැරණි සංස්කෘතිය වෙනස් කරලා නව සංස්කෘතියක් ඇති කරන්න යන ගමනේ පොළ සම්බන්ධව පමණක් නොව අනිත් කාරණා ගැනත් ගැටුම් ඇති නොකර කටයුතු කරගෙන යමු. මම ඇල්වතුර ටික විතරයි ගන්නේ. සභාවෙන් දෙන වෙන කිසි දෙයක් අරගෙන නැහැ. ඔබතුමාලගේ සංකල්පය අපෙත් තියනවා. අපෙත් සහයෝගය ගන්න. අපිත් මහජන නියෝජිතයෝ විදිහට ගම්වලට යන්න ඕනි. සමහර විට ඔබතුමා ලයිට් එක දාන්න දෙන් නැති වෙයි. ඔබතුමා හිතනවා නම් අවුරුදු හතර ඇතුළත මහජන නියෝජිතයින්ට ලයිට් නොදා ඡන්දය ගන්න පුළුවන් කියලා, බංගලාදේශය නේපාලය වගේ රටවල වෙලා තියන දේ පේනවනේ. පසුගිය අරගලවලදී ඔබතුමාලා සමඟ හිටියා. කැබ් එකේ ප්‍රශ්නයේ දී අපි ඔබතුමාලා සමඟ හිටියා. අපි ගෙවීම් අනුමත කළේ නැහැ. ඒ නිසා මම අරගලවලට ගියේ නැහැ. මිනිසුන්ට ගහනවට, ගෙවල් ගිනි තියනවට ඒ හැම දේකටම අපි විරුද්ධයි. පක්ෂයක් විදිහට ඔබතුමා තීන්දු ගන්නවා ඇති, පක්ෂයක් විදිහට අපි දහතුන්දෙනා ඔබගේ පාර්ෂිකයන්ගේ කකුළෙන් ඇද්දේ නැහැ. හැබැයි කොට්ඨාශයේ දිනපු මන්ත්‍රීවරයාට ලයිට් එකක් දාන්න දෙන්නේ නැත්නම් ඒ තුළ ප්‍රශ්නයක් තියනවා. ඒ වගේම අපේ යෝජනාවක් රීතිවලට පිටින් ගිහිල්ලා ඔබතුමා කටයුතු කරනවා නම් ඒකේ වැරද්දක් තියනවා. එතනට යන්න එපා. ගරු ලේකම්තුමිය ඔබතුමියගේ වගකීමත් ඒක. ඒ නිසා සභාපතිතුමා දැනුවත් කරලා අවශ්‍ය කටයතු සිදු කරන්න. ඔබතුමා දෙන නොදෙන එක වෙනම දෙයක්. මහජන සේවය වෙනුවෙන් මතක් කරනවා නම්, ගලතරය නාය යන අවස්ථාවේ මම එතැන වැඩ කරනවා ඔබතුමා එතෙන්ට ඇවිල්ලා කතා කරලා ගියා. කවදාවත් අපි විවේචනය කරලා නැහැ. අපි එහෙමයි වැඩ කළේ. මම කියන්නේ අපේ සහ ඔබතුමන්ලාගේ අදහස් සමානයි. එහෙම නැතුව ඔබතුමාලාගේ බලය, රැල්ල තියෙද්දි කොට්ඨාශයේ අපිව දිනවලා එවයිද? ඒ ගැන හිතන්න. ඒ නිසා කවදාවත් පුද්ගලික පලිගැනීම් කරන්නේ නැහැ අපිව තේරුම් ගන්න කියලා කියනවා. අපිට ගැටුම් ඇති කරගන්න අවශ්‍ය නැහැ. අපි සහයෝගය දෙනවා. ඔබතුමා පුද්ගලයෝ සමඟ විවේචනය කරලා තියනවා සත පහක්වත් අතුකෝරලාට දෙන් නැහැ කියලා. දේශපාලනය විනාශ කරනවා කියලා කමක් නෑ කිසිම අයුරකින් ඔබතුමා සමඟ තරහක් නැහැ. හෙට පොළේ ප්‍රශ්නය තුළ, පක්ෂ දහතුන් දෙනා නැතත් ඔබ හරි තැනක ඉන්නවා නම් අපි දහතුන්දෙනා ඔබත් සමඟ ඉන්නවා. තව අදහසක් ප්‍රකාශ කරන්න ඕනි. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අශෝක ගුණසේන මැතිතුමා මගේ ගමට ලක්ෂ හතක් දීලා තියනවා. මම දන්නැහැ කොහොම මේවා එනවද කියලා. ඒකෙත් පොඩි ගැටළු වගයක් ගිහිල්ලා දායක සභාවට මේක සිදු කරන්න කියලා ආවා. එතකොට ගරු අශෝක මන්ත්‍රිතුමා මාලිමා මන්ත්‍රීවරු සමඟ අතුකෝරාල මන්ත්‍රීතුමා මේ වැඩේ කරන්න කියලා යෝජනා කරලා තිබ්බා. සමහර අවස්ථාවල අශෝක මන්ත්‍රීතුමා අපිට වැඩ දෙන් නැහැ කියලා තමයි ප්‍රචාරය වෙලා තියෙන්නේ. ඒ නිසා මේ පණිවිඩය යන්න ඕනි. ලක්ෂ හතක මාලිමාවට ආපු යෝජනාව මාත් එක්ක උප සභාපතිතුමිය ලස්සනට ක්‍රියාත්මක කරනවා. ඇවිල්ලා බලන්න කවුද කරන්නේ කියලා. ඒ නිසා මැරෙන කල් ගැටුම් ඇති කරගන්න අවශ්‍ය නැහැ. මේ අවස්ථාවේ අපිව මේකට සම්බන්ධ කරගනිමින් කටයුතු කරන ලෙස උපදෙස් දීම සම්බන්ධ ගරු අශෝක මැතිතුමාට ස්තූතිවන්ත වෙනවා. ඡන්දය ආවාහම රැල්ලක් තියනවා නම් ලයිට් නෙවේ,පාරවල් නෙවේ, මහින්ද මහත්තයා මේ රටට මොනවාද නොකරේ. හොරකම් කරලා හරි නැතුව හරි මිනිසුන්ගේ රැල්ල ආවහම ආපසු යන්න වෙනවා. හදවතේ තියේ නම් මිනිසුන්ට කරපු දේවල් කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා අපහසුතාවයකට පත් කරලා නැහැ. ඔබතුමාට තියෙන හොඳම යෝජනාව පොළේ කමිටුව රැස්කරන්න. මන්ත්‍රීවරු විසිපස් දෙනාමත් රැස් කරන්න. අපිටත් ආසයි වංචාකරන්නේ කවුද ඒවාට උදව් කරන්නේ කවුද කියලා බලන්න. කිසිම ප්‍රශ්නයක් නැහැ ඔබතුමා නිවැරදි නම් අපේ තීරණ එළියේදී වෙනස් වෙන්නැහැ. ඔබතුමා මේ ප්‍රශ්නය ගැන හොඳ විදිහකට දකින්න. ඒ වගේම අපේ ප්‍රශ්නය ගැනත් හිතන්න. ලයිට් එක දාලා දුන්නැහැ කියලා ඡන්දය පිළිබඳ තීරණය කරන්න බැහැ. ඔබතුමා ලයිට් එක දාලා දුන්නා නම්, ඔබතුමා ගැන අපේ හදවතේ ලෙන්ගතුකමක් ඇති වෙනවා. ඉදිරියේදි අනිවාර්යෙන් සහයෝගයෙන් කටයුතු කරනවා. ඡන්දය වේලාවේ පට්ට යනකල් මඩ ගැහුවා මගේ මිත්‍රයා. මම ඒත් මගේ කිසිම පාර්ශිකයෙකුට මඩ ගහලා නැහැ.

අපි මැරෙන මිනිස්සු, මම මැරිලා පැය දාහතක් ඉඳලා ජීවත් වුණ මිනිහෙක්. අපි කරන හොඳ අපිට තියනවා. අපි සාකච්ඡා කරමින් කටයුතු කරමු. ඒ වගේම ඉදිරි කටයුතුවලදී ඔබතුමාට සහයෝගය දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, අතුකෝරාල මන්ත්‍රීතුමාගේ කතාවට එකඟ වෙනවා. මට කාරණා 3 විතරක් ඉදිරිපත් කරන්න වෙනවා. පළමුවැනි කාරණාව හැටියට යම් කරුණු නිසා හිත් රිදෙන්න පුළුවන්. තරහෙන් කරන ප්‍රකාශයක් නෙමේ. මම කණගාටු වෙනවා මහින්ද මහත්තයා ගෙයින් එළියට ඇදලා දාපු එක ගැන. මම සමගි ජන බලවේගය නියෝජනය කරන්නේ. මගේ කුඩා කාලයේ ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙකු ලෙස අපේ තාත්තා කැප්පිටිවලාන කාර්යාලයේ හිටපු උප සභාපතිතුමා ලෙස මහින්ද මහත්තයාගේ කාලයේ කටයුතු කරපු කෙනෙක්. මුල ඉඳලාම දේශපාලන කටයුතුවල හිටපු අය. ප්‍රේමදාස මහතා පාර මැද්දේ කොටි ඝාතනය කළා. චන්ද්‍රිකා මැතිනියගේ ඇහැක් අන්ධ කළා. මේ රටේ තිස් අවුරුද්දක යුද්ධය අවසන් කළේ හිටපු ජනාධිපති ගරු මහින්ද මැතිතුමා. මහින්ද මහත්තයාට කරපු දෙයින් මේ රටේ මිනිස්සුන්ට වඩා විදෙස් රටවල ඩයස්පෝරාවට සම්බන්ධ වුණ අය සතුටු වෙනවා කියලා මම මේ අවස්ථාවේ සඳහන් කරනවා. මහින්ද මහත්තයා වෙනම චරිතයක්, ඉතිහාසයේ ඒවාගේ චරිත කලාතුරකින් නිර්මාණය වෙන්නේ. ඒ නිසා යුද්ධය නතර වුණ දවසේ ඉඳලා නැති වෙන්න තිබ්බ දහස් ගණනකගේ ජීවිත බේරුණා. හැම කෙනෙක්ම මහින්ද මහත්තයාට ණය ගැතියි. එතුමාගේ ආරක්ෂාව හා අනිත් කටයුතු ගැන ඕනම රජයක් ඒ පිළිබඳව බලන්න ඕනි කියලා ප්‍රකාශ කරනවා. දෙවනි කාරණාව තමා මාලිමාවේ මන්ත්‍රීවරු කියන්නේ වැටුප් දීමනාව ගන්නැහැ කියලා. මේ සභාවෙත් තමුන්නාන්සේලා වැටුප ගන්නවද පැලවත්තට යවනවාද කියලා දැනගන්න අවශ්‍යයයි. එදා ඔබතුමා විපක්ෂයේ, අපි ආණ්ඩු පක්ෂයේ වැඩ කරානේ. එදා ඉඳලා තමයි ඔබතුමා හඳුනාගන්න ලැබෙන්නේ. මගේ වැටුප මම ගන් නැහැ කියලා කෙලින්ම ප්‍රකාශ කරන්න පුළුවන්. මෙවර මුල්ම වැටුප කිරිවානාපොල පන්සලේ සාමනේර හිමිනමකට පරිත්‍යාග කළා. දෙවන වැටුප මම මහයායේ පාරක් හදා ගන්න කියලා දුන්නා, සල්ලි ටික දුන්නහම ගල් ටිකත් දෙන්න වුණා ඒකට කමක් නැහැ. මේ පාරට ලබන දාහතරවෙනිදා කොන්ක්‍රීට් ටික දානවා අවශ්‍ය තාක්ෂණික කටයුතු ටික කරලා දෙන්න කියලා ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිනවා.

විශේෂයෙන් අපි දේශපාලනයේදී කිසිම වංචනික කාර්යයක් සිදු කළ අය නොවේ. ඔබ නිවැරදිව කටයුතු කරනවා නම්, අපිත් ඔබතුමා සමඟ ඉන්නවා. අපිටත් අවශ්‍ය ප්‍රදේශයට හරියට වැඩක් වෙන්න. ප්‍රාදේශී සභාවේ හිටපු අය විදිහට ඔබතුමාත් දන්නවා සමහරු කොහොමද ජරාව ගත්තේ කියලා වැඩ කරේ කියලා. සභාවට සම්බන්ධ නැති පිට අය තමා සභාවෙන් හොරකම් කරේ, ඒවා අපි දන්නවා. දැන් ඒවා සිදුවෙන් නැහැ. ඒ නිසා පක්ෂය මොකක් වුණත් භේදයක් නොකර කටයුතු කරනවා නම් ප්‍රශ්නයක් නැහැ. මට මතකයි ඔබතුමන්ලාට ප්‍රතිපාදන ලැබුන් නැහැ. ඡන්දය අවස්ථාවේදී මොනවා හරි දුන්නා. නමුත් ඔබතුමාට දහතුන්දෙනාගේ සහයෝගය ලබා දෙනවා. ඔබතුමාත් අපිට සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින් වැඩ කටයුතු සාර්ථක වේවා කියා ප්‍රාර්ථනා කරමින් නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා, පළමු වැනි කාරණය ලෙස පොළ සම්බන්ධව මතුකරන්න කැමතියි. මම නිතර පොළට යන කෙනෙක් එදා ඉඳලා මුදලාලිලා හය හත් දෙනෙක් සමඟ කතා කරනවා. ව්‍යාපාරිකයෙක් විදිහට ගරු සභාපතිතුමා ඔබතුමා මැදිහත් වෙලා අරගල කරා වගේ පොළ කඩන්න නොදුන්නා නම්, ඉතාමත් කාලෝචිතයි. පරණ පොළවල් වීදි ක්‍රමයට තිබුණා. බඩු ටික මුදලාලිලා උඩ තියාගෙන ඉන්නවා අපි බිමින් ඇවිදන් ගිහින් ගන්නවා. සාමාන්‍ය මට්ටමකට නැමිලා බඩුවක් ගන්න තිබ්බේ. පොළවල් ආපු ක්‍රමයේම වැරැද්දක් තියනවා. නාරම්මල, පොල්ගහවෙල පොළවල් දැක්කා අපිත් ඒක උදාහරණයකට ගත්තා. ඒ සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය තුළ යම් යම් කතිකාවත් කරන තැන්වල අපි විරුද්ද වුණා. කෝටි දාහතක් කියන්නේ විශාල මුදලක්. වීදි ක්‍රමයට තිබුණු පරණ පොළ තිබිලා, කාණු පද්ධතිය හොඳට හදලා මැදින් අංගනයක් සහිත වහලයක් ගහලා අර මුදලාලිලා ඒ විදිහටම තිබ්බා නම් හොඳයි. පිටිපස තිබුණු ගොඩනැගිල්ල ශක්තිමත්, ඒක තට්ටු දෙකට හැදුවා නම්, ලොකු මුදලක් යන්නේත් නැහැ. අද ඔය පොළ තිබ්බා නම්, පරණ මුදලාලිලා සහ කීර විකුණන වයසක අම්මලත් සතුටින් ඉන්නවා. ''අපි එදා ඉඳලා පොළේ හිටියා අපේ දරුවාට මුණපුරාට කාටහරි භාරදීලා යන්න තිබ්බා'' කියන අවස්ථාව කීර විකුණන අම්මලාට නැති කරලා තියනවා. ඒ නිසා පසුගිය දවස්වල ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා පොළට ගිහිල්ලා තිබ්බා. ලස්සන පොළක් හදලා තිබ්බත්, හැම තැනම ඉටි කොළ කැලි ගහගෙන ඉතාමත් අවලස්සන පොළක් අපිට දකින්න තියෙනවා. එතනදි පෙන්නලා දුන්නා මේවා අයින් කරලා විධිමත් ක්‍රමයකට තව මුදලක් හරි වියදම් කරලා මුදලාලිලාට ඉඩ ටිකක් තියන තැනක් හදන්න කියලා. සභාවටත් ප්‍රශ්නයක් තියෙනවා බිම ඉන්න මුදලාලිලා පැලට් ගහලා උඩට ඇවිල්ලා ඉන්නවා.

හවසට පැලට් හකුලන් යන්න ඕනි නැත්නම් සභාවට පොළ ශුද්ධ කරන්න බැරි ප්‍රශ්නයක් තියනවා. ඒක මුදලාලිලාට අමතර වැඩක්. කලින් දවසේ දඹුල්ලට හෝ කොළඹ ගිහිල්ලා රෑ 12.00 /1.00 වෙනකන් බඩු ගෙනල්ලා, ඔවුන්ගේ හිතවත් මිත්‍රයෝ ඒවා කිරලා ලස්සනට අඩුක් කරලා පාන්දර 04ට විතර වෙළඳාමට එනවා. ඊටපස්සේ රාත්‍රී 7.00 විතර වෙනකම් වෙළඳාම් කරලා වැඩ ඇරිලා එන ජනතාවට පොළේ බඩුවක් ගන්න අවස්ථාව දීලා තියනවා. ඉතින් ඒවා අස්කරන්න කාලයක් යනවා අනික ඉඩ ප්‍රමාණය වැඩි වෙන්න ඕනි. තොග මුදලාලිලා කියලා කොටසක් මේ පොළේ ඉන්නවා ඉස්සර පොළේ එහා පැත්තට වෙන්න මෙයාලා හිටියේ. ඒත් අද මොකද වෙලා තියෙන්නේ. තොග මුදලාලිලා හොඳ බඩු ටික අරගෙන එන තැනම එලාගෙන තියෙන්නේ. අතේ මුදලක් ඉතිරි නම්, තව මොනව හරි ගන්න තියේ නම් අපිත් අද තියන ආර්ථිකයත් එක්ක දවස් දෙක තුනක් බඩු ටික තියාගන්න බැරි වුණත්, ඒ බඩු අරගෙන යන්න පෙළඹෙනවා. පොළ විධිමත් විදිහට හදන එක ගැන කතා කරපු අතුකෝරාල මන්ත්‍රීතුමා ඇතුළු අනිකුත් සියලු මන්ත්‍රීතුමන්ලා විරුද්ධත්වයක් නැහැ. විධිමත් විදිහට කළ යුතුයි. මෑතක දවසක මම එදා පොළේ ඉන්නවා. එදා වැහිබර දවසක්. පොළ අඳුරුයි. ලයිට් එකකවත් එළිය නැහැ. තාක්ෂණික නිලධාරී මහත්වරු යොදවලා ඒවා වැඩද, එළිය අඩු ප්‍රදේශවලට ලයිට් දාන්න යොමු කරවන්න කියලත් ඉල්ලා සිටිනවා. ඒනිසා පාරිභෝගිකයාට ගුණාත්මක තත්වයේ බඩුවක් ගන්න පහසු වෙනවා. අනික ලස්සනට පොළ හදලා අද ස්ටෙප් එකක් නැග්ගහම ඒ තියන කැල්ල සම්පූර්ණ වාහන රථගාලක් වෙලා. පසුගිය දවස්වල මම දැක්කා හිටපු ජනාධිපතිතුමාගේ නඩු තීන්දුවට ගිය කෙනෙක් මෙතන වාහනය නවත්වලා කොළඹ ගිහිල්ලා. මම එවෙලෙත් මුදලාලිලාට කීවා. ගරු සභාපතිතුමාටත් දුරකථන ඇමතුමක් දීලා කීවා. ඒ නිසා එතන උඩ කැල්ලට එළියේ සිටින වෙළෙන්දෙක් හරි යොමු කරමු. එහි වාහන දාන්න දෙන්න එපා කියලා ඉල්ලීමත් කරන්න ඕනි. ඒ වගේම උඩ තට්ටුවට දොරවල් දාමු කියලා හොඳ යෝජනාවක් ඇවිත් තිබුණා. ඊයෙත් මට ගොවිජන සේවා එකේ නිලධාරිතුමියක් කතා කරලා ඇහුවා, අපේ වැඩසටහනක් තියෙනවා ප්‍රාදේශීය සභාවේ ගොඩනැගිල්ල අපිට ගන්න පුළුවන්ද කියලා. මං කීවා ප්‍රාදේශීය සභාව හදන නිසා සියලු නිලධාරීන් ඉන්නේ එම ගොඩනැගිල්ලේ කියලා, ඒ නිසා පොළේ උඩ තට්ටුව තියනවා ඒක ගන්න පුළුවන් කියලා. ඒ ගොල්ලෝ පරික්ෂාවට ගිහිල්ලා තිබුණා. එකේ වාහන ගහලා තිබුණ නිසා ඒක සුදුසු නැහැ කියලා තීරණය කරලා තිබුණා. ඒ නිසා ඔවුන් වෙන ස්ථානයක ගනී. ඒක ප්‍රාදේශීය සභාවට ආදායමක් එන එකක්. ඒ වගේම වාහන නැවැත්වීම නිසා අවධානමක් තියෙනවා. ඉතාමත් අවිධිමත් ලෙස හැදුණා කියන නිසා අපිටත් හේතු කාරණා දැන ගන්න අවශ්‍යයි. මෑත කාලයේ බුලත් පොළ උඩට දාල තියනවා නමුත්, පොළ ඇතුළට වතුර වැක්කෙරෙන නිසා, මුදලාලිලාට ඉන්න අපහසු වෙලා තියනවා. කරුණු ඔක්කොම සළකලා ඒ පිළිබඳව උඩ වතුර කාන්දුවට ආලේපයක් කරන්න තියෙනවා නම් ඒක හෙඳයි. අපි විධිමත්තාවයකින් යුත් ලස්සන පොළක් හදමු. ඉස්සර පොළට වඩා අලුත් පොළක් අලුත් විදිහකට ආවානම්, අපි කාටත් හොඳයි. නමුත් මේකේ අර්බුද ගොඩක් නිර්මාණය කරලා තියනවා. අර්බුද මොනවා වුණත් ගොඩක් ප්‍රජාව බලන්නේ තමන්ගේ වාසිය හැබැයි මහජන නියෝජිතයෝ විදිහට අපි තමා පොදු හැඩයකට බලන්නේ. අපි මැදිහත්වීමක් වෙලා මන්ත්‍රී මණ්ඩලයත් සමඟ සාකච්ඡා කර, වර්තමාන ආණ්ඩුවේ තියන“පොහොසත් රටක ලස්සන ජීවිතයක්” කියන දේ සැබෑවක් කරමු. ඒක නිසා එය මුදලාලිලා ඇතුළු අවට ප්‍රදේශවල ජනතාවටත් උදා කරලා දෙමුයි කියලා ඉල්ලා සිටිනවා. දේශපාලන සංස්කෘතිය ගැන කතා කරන නිසා කතා කරන්න හිතුණා. මම 1988/89 කාලයේ ඉඳලාම දේශපාලනයේ නියැලිලා දේශපාලනය ගැන අඳුනා ගත්ත කෙනෙක් විදිහට කතා කරන්න හිතුනා. මගේ අම්මා ගත්තහම සාමාන්‍යයෙන් කැපුවත් කොළපාට පාර්ශිකයෙක්. ඒක ගංගා මන්ත්‍රීතුමිය දන්නවා. එහෙම දේශපාලන සම්භවයක් තියන පරිසරයක් තිබ්බේ. අදටත් මගේ අයියා මට විරුද්ධ දේශපාලනයක් කරන්නේ. හැබැයි මට මතකයි 1994 දී මම අවුරුදු 24 ක තරුණයෙක් විදිහට ගේ ළග ඉන්නකොට, 94 ආණ්ඩුව දිනපු වේලාවේ පෙළපාලියක් ගියා, හැබැයි ගේ ළඟින් යද්දි පිරිමි සියලුදෙනා ආචාරශීලි බවින් තොරව හික්මීමමක් නොමැතිව හැසිරුණා. මාතර අක්කා කීවාහම අපේ අම්මාව ගොඩක් මිනිස්සු දන්නවා. ඒ නම කිය කියා තමා පෙළපාලියේ ගියේ. ඒ වේලාවේ තරුණයෙක් විදිහට උත්තර දෙන්න මට ලොකු හයියක් තිබුන් නැහැ. හැබැයි වාසනාවකට එක් කෙනෙක් මැදිහත් වෙලා අපේ නිවසට මොකුත් කරන්න ඉඩ දුන් නැහැ. ටිකක් ඉස්සරහට යන කොට මනි බඩු විකුණන මාමලාගේ ගෙදරට ගිනි තියනවා . එදා එහෙම සංස්කෘතියක් තිබුණේ. එදා ඉඳලා අපි විරුද්ධයි. අදටත් ඒ මිනිස්සු දුක් වෙනවා ඒ කරපු ක්‍රියාව ගැන. ඒ නිසා හොඳ දේශපාලන සංස්කෘතියක් හදාගෙන යන වේලාවේ අපි සියලු දෙනා ඒකරාශි වෙලා මන්ත්‍රීතුමාලා කීවා වගේ හොඳ සභාවක් ගෙනියමු. මහජන නියෝජිතයෙක් විදිහට බිමට යනකොට බිම අහන්නේ අපිට ප්‍රතිලාභ මොනවාද? කියලා. ඒවගේම මම ස්තුතිවන්ත වෙනවා. සභාවේ ගත්ත තීන්දුවකට කාර්මික කම්ටුවේදී මෝටර් ග්‍රේඩරය හෙණ්ඩුවාව වසමට හම්බ වුණා. හෙණ්ඩුවාව, හෙණ්ඩුවාව වත්තට එක දවසක් ලයිට් දැම්මා. කන්දේගෙදර උතුරට එක දවසක් දාගන්න හම්බ වුණා. ඊට පස්සේ කන්දේගෙදර දකුණ, පන්ගොල්ල ආවරණය වෙන්න තියෙනවා.

තව පොඩි කොටස් 02 ක් තියෙන්නේ. මම කොයි වෙලාවකටවත් ලයිට් දාන තැන හිටියේ නැහැ. අපේ ගමේ ප්‍රජාව සම්බන්ධීකරණය කරලා තියෙනවා. ස්වේඡා සංවිධානවල ඉන්න අය පක්ෂ පාට බැලුවේ නැහැ. ස්වේච්ඡා සංවිධානවල ඉන්න අයට කතා කරලා ලයිට් දාන්න එන අයත් සමඟ සම්බන්ධ වෙලා ඒ ප්‍රදේශයේ තියන ලයිට් එක දාගන්න, අලුතින් දාන්න දෙන්න එපා, ස්විච් කඩපු තැන් තියේ නම් දාන්න එපා, ප්‍රජාව ගුණාත්මක යාන්ත්‍රණය පහළට ගෙනියනවා නම්, ඒගොල්ලන්ගේ අවශ්‍යතාවය වෙනුවෙන් ඒ තැන්වල හිටගන් නැති තැන්වල කරන්න එපා කියලා ඔවුන්ට උපදෙස් දීලා තියෙන්නේ. පන්ගොල්ලට ජල ව්‍යාපෘතිය ගෙනාවා. ඒ සඳහා අනිල් මන්ත්‍රීතුමත් කතා කරා. එයාලගේ පාරටත් ගොඩාක් කල් ඉඳලා, අයඳුම්පත්‍ර දීලා තියනවා කියලා කීවා. ඒනිසා අනිල් මන්ත්‍රීතුමා හමුවෙලා වැඩපිළිවෙල කරන්නේ කොහොමද කියලා කතා කරා. ඒ පාරත් මීටර් දෙසීයක් විතර ආවරණය කරන්න භාර දුන්නා. ඒවගේම අරුණ මන්ත්‍රීතුමාගේ කොට්ඨාසයේත් වතුර නැති පහලගම ගල්ගමුව උතුර ප්‍රදේශවලටත් වතුර යන බට සෙට් එක එතන දාලා තියනවා. මගේ දේශපාලන බේදයක් නැහැ. පන්ගොල්ල කජු වැටිය කියන ප්‍රදේශයට ඉංජිනේරු මහතා සමඟ ගියාහම ඒ ගෙවල්වලට වතුර අවශ්‍ය නැහැ කීවා. නමුත් නැවත ඊයේ පෙරේදත් කතා කරලා කියනවා අපි රැස්වීම්වලටත් ආවා අපි ඡන්දයත් දුන්නා අපිට වතුර එන්නේ නැත්තේ ඇයි කියලා. අපි රැස්වීම්වලට ආවද, ඡන්දය දුන්නද, වෙන පක්ෂයකද, ඉන්දියාවේ ඉඳලා ආවද කියලා බලන් නැහැ, අවශ්‍යතාවය තියනවා නම්, ගම මැදට හරි වතුර ලයින් එක ගේනවා. ඊටපස්සේ අතුරු මාර්ග ටික පෙළගස්වනවා. හැම තිස්සේම ප්‍රතිලාභ ලබා ගන්න කටයුතු කරන්නේ කියලා මම එවෙලේම එයාලට පැහැදිලි කරලා දුන්නා. අදම ගෙවල් ටිකේ අයදුම්පත්‍ර පුරවලා, අහවල් තැන නියෝජිතයෙක් ඉන්නවා එයාට භාර දීලා අදාල කටයුත්ත කරගන්න කියලා කීවා. මම කන්දෙගෙදර කොට්ඨාසයේ වගකීම භාර ගත්තා. අපේ අනිල් මන්ත්‍රීතුමත් හැම වෙලාවේම අපිත් එක්ක කතාකරනවා. ලයිට් දාන්න ගියත්, අපේ අයගේ ගෙවල් කියලා දාන්න කියන් නැහැ. එක් කෙනා දෙන්නා මටත් යම් යම් චෝදනා කරනවා. ගරු සභාපතිතුමාටත්, මන්ත්‍රීතුමන්ලාටත් කියලා තියනවා මම කොට්ඨායේ වැඩවලට මැදිහත් වෙන් නැහැ කියලා. නමුත් පන්ගොල්ල, කන්දේගෙදර උතුර දකුණ, හෙණ්ඩුවාව, හෙණ්ඩුවාවත්ත යන ප්‍රදේශවලට මැදිහත් වීම මම කරන්නේ කොහොමද කියලා ඒ ගමේ ප්‍රජාව දන්නවා. හැම වෙලාවේම අපි ප්‍රජාවගේ අවශ්‍යතාවයන් ඉල්ලා ගන්නවා. ඒවගේම බුම්වලේ ප්‍රශ්නයට හැමදාම මම කතා කරනවා. පසුගිය සතියම අලව්ව ප්‍රාදේශීය සභාවට ආවා. ඊළඟ වැස්ස ආවොත් එතනින් යන්න බැරිවෙනවා. ප්‍රජාව කරපු ඉල්ලීමට ලේකම්තුමිය එවලෙහිම JCB යොදවලා එහා පැත්තේ තිබ්බ හියුම් පයිප්ප ටික ගහලා පස් දාලා දුන්නා. දැන් ආයෙත් පොත්තක් වගේ පෑදිලා තියෙන්නේ. ඒවගේම පසුගිය දවස්වල එතෙන ප්‍රශ්න ටිකක් තිබුණා. ඒ ටිකත් ඉක්මනින්ම පටන් ගමු. ඒ නිසා හැමදෙයක්ම එකතු වෙලා කරමු. මෙම පොළේ ප්‍රශ්නයටත් සාමූහිකව මැදිහත් වෙමු. වත්මන් අතිගරු ජනාධිපතිතුමත් කියන්නේ සාමූහිකව අපි ගමනක් යමු කියලා ඒනිසා, ඉදිරියටත් අපි එකතු වෙලා කටයුතු කරමුයි කියලා ඉල්ලමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, අලව්ව පොළ මුලින්ම හදන්න පටන් ගත්තේ 1998 දී. අශෝක ගුණසේන මන්ත්‍රීතුමත්, ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමත් ඉන්න කාලේ තමා පොළ නිර්මාණය කළේ. ඒ පොළ නිර්මාණය කරලා හැම මන්ත්‍රීවරයෙකුටම අවශ්‍ය කඩ කාමරයක් ගන්න කීවා. මම ඇතුළුව අශෝක මන්ත්‍රීතුමාවත්, ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමාවත් කඩ කාමර ගත්තේ නැහැ. ඒ කාලයේ ව්‍යාපාර කරපු මන්ත්‍රීවරුත් කඩ කාමර ගත්තා. ඒ කාලයේ නිර්මාණය කරපු පොළ තමා දැන් ජනතාව අලුත් විදිහකට නිර්මාණය කරලා ප්‍රතිසංස්කරණය කරලා ඇවිත් තියෙන්නේ. මේ වෙනකොට අර්බුදයක් මතු වෙමින් පවතිනවා. උද්ධාල මන්ත්‍රීතුමා කීවා වගේ මමත් හැමදාම පොළට යනවා. වෙළඳ මහතුන්ගේ ප්‍රශ්න අපිටත් කියනවා. ඔබතුමා පොළ හදන්න යන ක්‍රමවේදය ගැන ලොකු ගැටළුවක් නැතත්, පොඩි ගැටළු කීපයක් තියනවා. ඒ නිසා ඒක නිර්මාණය කරන විට, අපි සියලු දෙනාම කැඳවගන්න පුළුවන් නම් හොඳයි. අපිටත් ඒ ගැන අත්දැකීම් තියනවා. ඒවගේම රාජ් කුමාර් මන්ත්‍රීතුමා කීවා වගේ එහා පැත්තට යනකල් පලය දික් කරගන්න පුළුවන් නම් මේක වඩාත් සාර්ථකයි කියලා හිතනවා. දැනට ආවරණය යෙදුවහම වාහන අංගනයක් නැතුව යනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමා, එයාලව ඇතුළට ගන්නවා .ඔබතුමා කතා කරන්න මම පස්සේ උත්තර දෙන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එහෙම නම් හොඳයි. නැත්නම් විශාල අලාභයක් සිද්ධ වෙනවා. පාරේ තදබදයකුත් ඇති වෙනවා. මේ පොළ නිර්මාණය කරන විට මම හිටියේ නැහැ නැත්නම් අවබෝධයක් ගන්න තිබුණා. මේකේ යම් යම් සාර්ථක කොටස් තියනවා. සමහර තැන්වල අසාර්ථක කොටසුත් තියනවා. ව්‍යාපාරිකයින්ට ඉන්න තියන තත්වය සුදුසු නැහැ.

ඒවගේම පාරිභෝගිකයන්ටත් ගැටලු සහගත තැන් තියනවා. ඒ නිසා ඒ තත්වය සමනය කරලා සුදුසු තත්වයකට එන්න පුවළුන්, ඒ තැන අපි ඔබතුමා සමඟ ඉන්නවා. ඉදිරියේදී සාකච්ඡා කරන කොට, අපිවත් සම්බන්ධකර ගන්නවා නම් හොඳයි කියලා විශ්වාසයක් මට තියනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, සමන්ත යත්තල්ගොඩ මන්ත්‍රීතුමාගේ කාලයේ හදපු පොළේ එක ඇස්බැස්ටස් එකක්වත් කැඩිලා තිබුණේ නැහැ. එක ලීයක්වත් දිරලා තිබුණේ නැහැ. අපි නිකම්ම විරුද්ධ වුණා නෙවේ. ලොකුම අඩුපාඩුවකට තිබුණේ කාණු කැට කැඩිලා තිබුණ එක. අපි ඉල්ලීමක් කරා මෙච්චර දැවැන්ත මුදලක් මේකට වියදම් කරන්න එපා කාණු කැට ටික හදලා වැසිකිලිවල ටයිල් අල්ලලා පොඩි වියදමකින් මේක ප්‍රතිසංස්කරණය කරලා දෙන්න කියලා. කෝටි දාහතකටත් වඩා වැඩියි. ඒකේ ප්‍රතිඵලවත් හම්බ වෙලා නැහැනේ. මේක කලින් දැක්ක නිසා තමා විරුද්ධ වුණේ. දැන් හැදුවා කියන්නකෝ, හදන කොට ඒකට කැමැත්ත පළ කර සම්බන්ධ වුණු කවුරුත් හදන ගොඩනැගිල්ල මොකක්ද කියලවත් දන්නැහැ. තට්ටු දෙකකට එනවද කියලාවත් දන්නැහැ, කට්ටිය හිතන් හිටියේ නාරම්මල වගේ තනි තට්ටුවට ගහයි කියලා. මගේ වේදනාවට මම බලන්නවත් ගියේ නැහැ. පොළ හදන්න එකඟ වුණු අය අවසානයේ ගොඩනැගිල්ලේ මැදක් හදලා යනකොට තමා දන්නේ මොකක්ද හදන්නේ කියලා. දැන් සාකච්ඡා වුණු දේවල් එදා පොළ බෙදනකොටත් ඉදිරිපත් කරා නම් හොඳයි. කාටත් එදා දේශපාලනය කතා කරන්න දුන් නැහැ. අද ඔයාලට දුක්ගැනවිලි ඉදිරිපත් කරන මිනිස්සු එදා ඒක සාධාරණව බෙදා ගන්න තිබුනේ. එහෙම නැහැ කෙලින්ම මන්ත්‍රීතුමාට කතා කරලා මෙතන මම කියලා බෙදා ගත්තා. අපි කවුරුත් සම්බන්ධ වුණේ නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එතකොට සභාව විසිරුවලා තිබ්බේ එතකොට කියන්න බැහැනේ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, එතනදී දේශපාලනිකව තම තමන්ට අවශ්‍ය තැන් අත්පත් කර ගත්තා. බෙදුවේ නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එහෙම කරලා තියෙනවා නම් පැහැදිලිවම වැරදි.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, ඒක තමා ප්‍රශ්නය. අපි වැරැද්දක් කරනවා නම් තමා ඕක ගැටුමක් වෙන්නේ. අපි සාධාරණව ඉෂ්ඨ කරනවා නම්, කවුරුවත් විරුද්ධ වෙන් නැහැ. මම ඒක දන්නවා. අපි පෞද්ගලිකව ඒ ගැන හිතලා එහෙම කරන් නැහැ. ඉතිහාසයේ කරලත් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා**
"පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" අරමුණු කරගෙන ජාතික ජන බලවේගයේ ආණ්ඩුව ඇතුළේ නාරද මන්ත්‍රීතුමා දේශපාලනික අදහස් දැක්වීම සම්බන්ධව වැරදි අදහසක් සමාජගත වෙන්න පුළුවන්. ඇත්තටම ඒ පනත ගෙනාවේ විශ්‍රාමික ජනාධිපතිවරුන්ගේ තියන වරප්‍රසාද කප්පාදුවක් කරන්න. ඒක අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේත් තිබුණා. මහින්ද මහත්තයා එළියට දාන්න කරපු වැඩක් නෙවේ මන්ත්‍රීතුමා. ඒක පොදුවේ පාර්ලිමේන්තු විවාද ඇතුළේ දැක්කා. ලක්ෂ කෝටි ගණන් මුදල් නාස්ති කරලා තිබුණා. කොරෝනා වසංගත තත්ව හමුවේ මිනිස්සු මැරුණු කාලේ කෝටි ගණන් මුදල් වියදම් කරලා තියනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. මන්ත්‍රීවරයෙක්ට මන්ත්‍රීවරයෙක් උත්තර දෙන්න බැහැ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, වෙනත් කරුණු යටතේ අදාල කාරණා නෙවේ. නවත්ත ගන්න තිබ්බා. දේශපාලන කාරණා මේ සාකච්ඡාව ඇතළේ ගන්න අවශ්‍ය නැහැ. මම නොදැන නෙවේ. එතුමාට කතා කරන්න ඉඩ දීලා හිටියේ. මහලොකු දෙයක් නෙවේනේ. ඇත්තටම වෙනත් කාරණා කියලා තියෙන්නේ අපේ සභාවට අදාල කාරණා සාකච්ඡා කරන්න පමණයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එහෙම එකක් නැහැ. වෙනත් කරුණු කියන්නේ දේශපාලනික කතිකාවත්නේ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, එහෙම නැහැ. රටේ ප්‍රධාන දේශපාලනය අරගෙන ඇවිල්ලා කතා කිරීම අපි කරන වරද්ද ගැනිල්ලක්. අපට මෙතන දවස් දෙකක් හරි කතා කළ හැකියි. මම ගරු මන්ත්‍රීතුමන්ලාට අවස්ථාව දුන්නා මම වචනයක්වත් බාධා කළේ නැහැ. නමුත් මම ඒක නොදැන නෙවේ. අපි සාමූහිකව අදහස් ප්‍රකාශ කරන්න ඉඩ දීගෙන යනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එතුමා පිළිතුරු දුන්නේ නාරද මන්ත්‍රීතුමාටයි. එහෙම මන්ත්‍රීවරයෙකුට පිළිතුරු දෙන්න බැහැ. ඔබතුමාටයි පිළිතුරු දෙන්න ඕනි. ඒකයි රීති ප්‍රශ්නයක් කීවේ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව දෙන්නම්. අපි සාමූහිකව කටයුතු කරගෙන යමු. මම කියන්නේ රජයේ දේශපාලනය මෙතෙන්ට ගේන්න අවශ්‍ය නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, රටේ ප්‍රශ්නයක් මතුවුණාම ඒක වැරදි කියලා ප්‍රකාශ කරනකොට ඒක සමාජගත වෙන වැඩක්. ප්‍රතිපත්ති ප්‍රකාශයේ තිබුණු දෙයක්. විශාල කෝටි ගාණක මුදල් නාස්ති කරපු වැඩක් නිසා විශ්‍රාමික ජනාධිපතිවරුන්ගේ වරප්‍රසාද කප්පාදු කිරීමේ පනත හොඳයි කියලා මම ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අපිට අදාල කරුණු දෙකක් තියනවා. අපේ අලව්ව ටවුන් එකේ වැඩ ඉවර නැහැ දෙපැත්තේ ප්ලැට්ෆෝම් දෙකක් සහ පේමන්ට් එකක් තියනවානේ. ඒ දෙකේ දෛනික වෙළඳාම් කරන මිනිස්සුන්ගෙන් කඩ කුලී අය කරන්නේ සභාවෙන්ද?

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, දෛනිකව කියන්නේ පොළ දවසට දාගෙන ඉන්න අයගෙන් අයකරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
අනිත් දවස්වලට?

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, අනිත් දවස්වලටත් ගන්නවා. තීන්දුවක් තියනවා. දැනට සිදුකරන සංවර්ධන කටයුතු අවසන් වුණාම, මහ වීදියේ කිසිදු වෙළඳාම් කටයුත්තකටවත්, බෝර්ඩ් එකක්වත් තියන්න අවසර දෙන්නැහැ. මාර්ග සංවර්ධන අධිකාරියත් ඒ ගැන ඇහුවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒක හොඳයි. අද ප්ලැට්ෆෝම් එකේ යන්න බැහැ. ඔබතුමියලාත් රාජකාරිය අවසන් වෙලා යනකොට කඩකාරයෝ ඉස්සරහට බඩු ගෙනල්ලා ප්ලැට්ෆෝම් එකේ තියන් ඉන්නවා දැකලා ඇති. බැංකුව ඉදිරිපිට සිම් විකුණන කොටස් ටිකක් පාරේ යන මිනිස්සුන්ට යන්න දෙන් නෑ ඇගේ හැපි හැපී ප්ලැට්ෆෝම් එකේ ඉන්නවා. ඒක හරි අශෝභනයි.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීවරුනි, ඒ සම්බන්ධයෙන් අපි තීන්දුවක් ගමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අනාගතයේදී ගත යුතු තීන්දුව දැන්මම අරන් තිබුණහම හොඳයි. දෙවනි කාරණය තමා එදා කමිටුවේදී කීවා පොළේ තියන උඩ කැල්ලෙහි තාවකාලිකව වේදිකාවක් ගහලා දෙපැත්ත බට පදුරුවලින් ආවරණය කරලා ගේට්ටුවක් දාමු කියලා. අපේ සභාවේ ගොඩනැගිල්ල නැති නිසා මේ හරහා සභාවට ආදායමක් උපයා ගන්න කටයුතු කරමු කියලා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, ඒක අපි දැනටමත් දෙනවා ඒත් අර කියපු වැඩ ටික තාම කරලා නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, දැනට පොළේ ගොඩනැගිල්ල දුන්නත්, ඒක ගොඩාක් දෙනෙක් ගන්න අකමැතියි. උද්ධාල මන්ත්‍රීතුමා කීවා වගේ ගොවිජන සේවා එකෙන් ගන්න එක නොවුණේ සිද්ධියක් නිසා කියලා. ඒනිසා ඒකේ අපි වාහන ගාල් කරන එක නතර කරමු.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, අපි තීන්දුවක් අරන් තියෙන්නේ, ඒකට වැටක් ගහලා හදනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, සමහර වෙලාව වැටක් ආවරණය කරලා නැති නිසා නාට්‍ය පෙන්නන්න එහෙම ගන් නැහැ. මේක ආවරණය කළොත් තව අවස්ථා එන්න පුළුවන්. මේකට පොඩි මුදලක් යයි. ඊළඟට උද්ධාල මන්ත්‍රීතුමා එයාගේ කොට්ඨාසයේ ලයිට් දාන ඒවා ආවරණය වෙලා කියද්දී දුකකුත් හිතුණා. නවත්ල්වත්තට එක දවසක් ආවා. ඒ දවසේ සිසිර මන්ත්‍රීතුමත් ඉන්නවා. නවතල්වත්තේ ටික විතරක් දැම්මා. හෙට්ටිගෙදර පන්සලෙන් මැසිවිලි නගනවා, ඒ පන්සල ඉදිරිපිට ලයිට් එක දාලා දෙන්න කියලා. දැන් ඒක දාලා දෙන්න විදිහක් නැහැ. ගල්දෙණිය, වේදෙණිය, හෙට්ටගෙදර, බෝගහවත්ත යන ප්‍රදේශවලට අපි දෙන්නට එක දවසක් දුන්නා නම් ඇති. ප්‍රශ්නයක් නැහැ. සිසිර මන්ත්‍රීතුමා ගිහිල්ලා දාගත්තත් ප්‍රශ්නයකුත් නැහැ. අපි නැතුව ඒ ටික දැම්මත් කමක් නැහැ. ඒ ටික ආවරණය වෙනවා නම් හොඳයි. ඊළඟට තව ප්‍රශ්නයක් තියනවා. පොළ ටෙන්ඩර් කරාද? ටෙන්ඩර් කරන්න කාලයක් තියනවාද? නැත්නම් පොළ සභාවෙන් කරනවාද?

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, පොළ ටෙන්ඩර් කරලා නැහැ. සභා තීන්දුවක් අරගෙන සභාවෙන් කරන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ පිළිබඳව දැනුවත් වෙන්න ඕනි. මිනිස්සු විමසද්දී පිළිතුරු දෙන්න බැහැ. බොහොම ස්තූතියි. අපි සියලු දෙනාම එනකු වෙලා ඉදිරියට වැඩ කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, සභාවේ පොඩි අර්බුද ටිකක් නිර්මාණය වෙලා තියනවා. නියපොත්තෙන් කඩන්න තියන එක පොරවෙන් කපා ගන්න ඕනි නැහැ සභාපතිතුමනි. ඒ නිසා අපිට ඔබතුමා සහ ලේකම්තුමිය සමඟ සභාව අවසන් වූ පසු විනාඩි කීපයක සාකච්ඡාවක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා. මම හැම වෙලාවේම උත්සාහ කරන්නේ, සහයෝගයෙන් සමගියෙන් ඉඳලා ජනතාව අපෙන් බලාපොරොත්තු වෙන යම් අරමුණකට වැඩ කරන්න. ඒ සඳහා ප්‍රාදේශීය සභාවේම සහයෝගය ශක්තිය අවශ්‍ය වෙනවා. ඒ කටයුතුවලදී මහජන නියෝජිතයෙක් හැටියට අපේ කමිටුවලට ප්‍රාදේශීය සභාවට කතා කරලා ජනතාවගේ අදහස් උදහස් දැක්වීම අපේ යුතුකමක්. ඒ වගේම දේශපාලන මතවාද දෙකක හිටියත් 60000 ක් විතර ඉන්න ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සියලු දෙනාගේම අරමුණ එකයි. පක්ෂයක අනන්‍යතාවයක් තියෙන්න පුළුවන්. මේ හැම කෙනාම පක්ෂයක් තෝරා ගන්නේ මහජන නියෝජිතයෙක් හැටියට දේශපාලනයට එන්න. අවසානයේ බලාපොරොත්තුව තමන්ගේ ප්‍රදේශයේ ජනතාවට යම් සේවයක් ඉටු කරන්න. දේශපාලන කාලයේදී අවසාන අරමුණ පොදු ජනතාවට සේවය කරන්න අවශ්‍ය යැයි කියන පොදු අරමුණේ අපිත් ඉන්නවා. වෙනත් ප්‍රාදේශීය සභා සහ දේශපාලන මැතිවරණ කොට්ඨාස ගත්තහම මරාගන්න, සුළු එදිරිවාදිකම් පවත්වන, වෛරයෙන් ක්‍රෝධයෙන් ඉන්න ප්‍රදේශ සහ දඹදෙණි ආසනයේ ඉතිහාසය තුළ සිද්ධි වෙලා නැතුවා නෙවේ. ඒ සිද්ධිවලට සාපේක්ෂව අලව්ව ප්‍රාදේශීය සභාව හොඳ විනයක් ඇතුළේ ගමන් කරනවායි කියලා මම විශ්වාස කරනවා. පොළේ කාරණයක් සම්බන්ධයෙන් මෙතන කතා කරා. මම හිතන්නේ මෙම මන්ත්‍රී කණ්ඩායම කැඳවලා පොළ හදන්න හේතුවුණේ ඇයි කියන කාරණාවයි පොළ හදන්න අවසාන අරමුණක් ඇති මේක හදලා තියෙන්නේ මොකටද නිර්මාණය වුණේ කොයි විදිහටද කියන එක ඔබතුමා දන්නවා ඇති, ඒ නිසා ඒ පිළිබඳව දැනුවත් කරන්න ඕනි. මේ පොළෙන් අපි අපේක්ෂා වුණේ මොකක්ද කියන එක, බඩු විකුණන එක විතරද නැත්නම් ඊට එහා ගිය කාරණාවක් තියනවාද කියන එකත් දැනුවත් කරන්න. ඒ වගේම පොළේ සාමාජිකයෝ සහ වෙළඳ සංගමය සමඟ සාකච්ඡා කරන අවස්ථාවේ සභාපතිතුමා විතරක් නෙවේ මේ සියලු මන්ත්‍රී මණ්ඩලයම කැඳවන්න කියන ගෞරවනීය ඉල්ලීමත් ඔබතුමාට කරනවා. ඒකේ තීරණය ඔබතුමා සතුයි. ඔබතුමාට ඒකට බලය තියනවා. බලහත්කාරයෙන් අපිට කියන්න බැහැ. ඒ සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ගෙත් අදහස් තියනවා ප්‍රකාශ කරන්න. පොළ ගැන උද්ධාල මන්ත්‍රීතුමත් කීවා. අපි ඔය පොළට ගිය පාර විරුද්ධ වුණා සභාපතිතුමා. කෝටි හතයි ගාණක මුදලක් ආවේ. ඒ වෙලාවේ ඉල්ලීම වුණේ පොළ නෙවේ. දැඩි අවශ්‍යතාවක් ලෙස අපි කීවේ මේ සල්ලි ටික දීලා අලව්ව නගරය හදන්න, වීදි ටික හදන්න කියලා. අපේ සභාපතිතුමා ඇතුළු අපි ඔක්කොම ඒ තැන හිටියා. ඒ වෙලාවේ ඉල්ලීම දුන්නහම කීවා මේ ප්‍රතිපාදන වෙන් වෙලා තියෙන්නේ පොළ ඉදි කරන්න විතරයි වෙනත් ක්‍රියාවලියකට ගන්න බැහැ කීයලා. අන්තිමට පොළ ඉදි කරන තැනට අපි ආවා. මුදල් ටික දෙවනි වතාවටත් ආපහු යනවා නම් අපරාදේ නිසා. අපි පොළ හදන තීරණයට ආවහම කාලය අවසන් වෙලා සල්ලි ටික ආපහු ගියා. මේ කියන්නේවිවාදය ඇතුළේ සත්‍ය කාරණයක්.

එදා කෝටි හතකින් හදන්න තිබ්බ එක අද කෝටි දාහකත් විතර ගිහිල්ලා. ඒ අවුරුදු කීපයක ඇතුළේ, එදා අපි රුපියල් අටසියයට දාපු අඩි හැට, අද කොන්ක්‍රීට් එක දාන්න පුළුවන් අඩි විසිපහයි. ඒ නිසා වර්තමානයේ ආදාහනාගාරයක් ඉදි කිරීම සම්බන්ධයෙන් න්‍යාය පත්‍රයට ඇතුළත් කරලා තිබ්බා. අලව්ව බල ප්‍රදේශයට වෙන්න ඕනි දෙයක්. එම භූමිය නිදහස් කර ගැනීම සඳහා අපි සහයෝගය ශක්තිය දෙන්න ඕනි. ඒක අත්‍යවශ්‍ය කාරණාවක්. ආදායම් උත්පාදනය කරන ක්‍රියාවලියක්. එදා පොළේ තිබුණු ඇස්තමේන්තුවෙන් කරන්න බැහැ. එදා ආදාහනාගාර ඇස්තමේන්තුවෙන් කරන්නත් බැහැ. අද ගත්තහම කෝටි දාහතරකට පහළොවකට විතර යයි. අද මේ රටේ මිල ගණන් එක්ක ඇස්තමේන්තු මුදල වැඩි වෙනවා. ඒවගේම කෝටි දාහතකට ඇස්තමේන්තු මුදල ගියා. ඒ පොළ හදනකොට දේශපාලනික විපර්යාස ගණනාවකුත් තිබ්බා. ජනාධිපතිවරයා වෙනම පැත්තක, මන්ත්‍රීවරයා කොට්ඨාසයේ වෙනම පැත්තක. මතුපිටට මේවා පැමිණියේ නැති වුණාට, ඇතුළාන්තයේ යම් යම් කාරණා තිබුණා. ඒවත් එක්ක පොළේ ඉදි කිරීම් කරද්දී, යම් යම් කාරණා සිද්ධ වෙන්න ඇති. පොළ බෙදන අවස්ථාවේ පාර්ලිමේන්තුව විසුරුවා හැරුණා. අපේ මැදිහත් වීමක් තිබුණේ නැහැ. ඒ නිසා මන් හිතන්නේ ඒ කාලයේ හිටිය නිලධාරී මණ්ඩලය ඇතුළේ තමා ඒ කාර්යය සිද්ධ වුණේ. ඒකට අපි මැදිහත් වීම් කළේ නැහැ.

නමුත් ගරු සභාපතිතුමා තව කාරණයක් මතක තියා ගන්න ඕනි. අත්දැකීම් සමඟ කියන්නේ. පොළ සම්බන්ධව හිටපු සභාපතිවරු තීන්දු තීරණ ගත්තහම උඩින් ගෙනාපු අරමුණුවලටට වඩා වෙන අරමුණක් යටින් තිබ්බා. ඉතිහාසයේ හිටපු සභාපතිවරු පොළ පිළිබඳව තීන්දු ගත්තා. සභාවට එක කාරණාවක් ලස්සනට මවා පාලා ඒක ඇතුළේ යම් අරමුණක් තිබ්බා. එක්කෝ හිතවත් කෙනෙක් ඉදිරියට ගන්න එයාට කඩ කාමරයක් දාගන්න. එයාලා පොළේ වෙළඳාම් කරන තැනට දාන්න. ඒවගේ අරමුණු තිබ්බා. ඒ අරමුණෙන් තොර අරමුණු ඔබතුමා ළඟ තියෙන්නේ. ඔබතුමා එහෙම නැහැ. මේක සද්භාවයෙන් කරන්නේ. පොළේ සියලු දෙනා හාල් කිලෝ එකක් ගන්න මහන්සි වෙන මිනිස්සු, උත්සාහ කරන මිනිස්සු ඉන්නේ. ඒ මිනිස්සු පිටුපසට ගිහිල්ලා ලොකු අපහසුතාවයකට පත්වෙලා තියෙන්නේ කියනවා. අපි ඒ ගැන කතා කරන්නත් ඕනි. ඒ මිනිස්සු ඉදිරියට ගනිද්දී අනිත් අය දාන්න තැනකුත් හිතන්නත් ඕනි. ඒ නිසා සාධාරණ ක්‍රියාවලියක් ඇතුළේ ඔබතුමගේ නායකත්වයෙන් ඒ පොළේ ඉන්න අයව සහභාගී කරගෙන ඒ කාර්යය කරමුයි කියලා ප්‍රකාශ කරන්න ඕනි. තව කාරණයක් තියනවා. පෙර අවස්ථාවේදී දේශපාලනික වශයෙන් කතා කරපු දෙයක් නෙවේ. රීති ප්‍රශ්නයක් නිසා "සභාපතිතුමනි" යනුවෙන් ආමන්ත්‍රණය කළ යුතු බව යත්තල්ගොඩ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළේ. ප්‍රශ්නය ඒකට උත්තර දීපු එක නෙමේ. "නාරද මන්ත්‍රීතුමා" කියලා ආමන්ත්‍රණය කිරීමේ රීති ප්‍රශ්නයක් මතු වුණේ. ඕනිම සභාවක සභාපතිතුමාට ආමන්ත්‍රණය කළ යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ කවුරු හෝ කාරණයක් සම්බන්ධයෙන් අදහස් දැක් වූ විට ඊට ප්‍රතිඋත්තරයක් දෙන්න ඕනි. ඉතින් දේශපාලනික වශයෙන් සලකා බැලුවහම, එකේක කාලවල පක්ෂවල විවිධ අයුරින් සිද්ධීන් වෙලා තියනවා. ඉතිහාසය ඇතුළේ ලොකු කාරණා තියනවා. සමහර කාලවල බස්නැවතුම්පලේ අධ්‍යාපන අධ්‍යක්ෂකවරු කොළ පාට වතුරෙන් නාවලා තියනවා. සමහර කාලවල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපි 88/89 කාල පරාසය ඇතුළේ ආණ්ඩුවෙන් සහ ගමේ ප්‍රශ්න දෙකටම මැදි වුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බැට කෑවා. එවකට ආණ්ඩුවෙන් හමුදාවෙන් අපේ කට්ටිය ගෙනියනවා. ජනතා විමුක්ති පෙරමුණේ අරගලයෙනුත් බැට කෑවා. මේ ඉතිහාසය පිළිබඳව සෑම අවස්ථාවකම හාර අවුස්සන්න ගිහාම යමක් කරන්න වෙන් නැහැ. ඒ පිළිබඳව දැනුවත් වෙමින් අවබෝධය ලබා ගෙන ඉතිහාසයේ දේවල් උකහා ගනිමින් වර්තමානය නිවැරදි කර ගනිමින් අනාගතය නිර්මාණය කරන්න ඕනි කියලා මම ඉල්ලා සිටිනවා. අපි හැම වෙලාවේම ජනතාව වෙනුවෙන් සියලු දෙනා එකතුවෙලා සහයෝගයෙන් ශක්තියෙන් කටයුතු කරමුයි කියලා ඉල්ලීම කරමින්, ගරු සභාපතිතුමනි අපිට සාකච්ඡාවක් ලබා දෙන්න කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. චමින්ද මාල් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරයෙක් ඇහුවා අපි පඩි ගන්නවද කියලා. මම ඒකට උත්තරයක් දෙන්න ඕනි කියලා හිතුණා. සමහර තැන්වල අපේ අත්සන් ලේඛන හුවමාරු වෙනවා දැක්කා,ඒ නිසා උත්තර දෙන්න අවශ්‍යයි. පළමුවැනි වාරයේ අපේ නමට චෙක්පත ආවා . එම අවස්ථාවේ අපේ පොදු ගිණුමක් ආරම්භ කරලා නැති නිසා ඒ චෙක්පත ආපසු භාර දුන්නා. නමුත් දැන් අපි පොදු ගිණුමක් හදලා ඒකට අපේ වැටුප බැර කරනවා. අපි ස්වේච්ඡාවෙන් වැඩ කරන නිසා වර්ෂ අවසානයේ පොදු වැඩක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ.උද්ධාල අරුණසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මුහුණු පොතට අපේ අත්සන් ලේඛන දාලා තිබ්බා ඒක තොරතුරු පනත හරහා යොමු කරාද කියලා දැනගන්න අවශ්‍යයි.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, අපේ චෙක්පත අරමුලකට ගියත් අත්සන් ලේඛනයේ අත්සන් කරන්න ඕනි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**
ගරු සභාපතිතුමනි, පල්ලේමෝරුගම ප්‍රදේශයේ වැසිකිලි ආධාරයක් සම්බන්ධයෙන් ඉල්ලීමක් කරලා තිබුණා. ඒ සම්බන්ධයෙන් නිලධාරීන් දෙදෙනෙක් ස්ථානීය පරීක්ෂණයක් කළා කීවා. ඒ පුද්ගලයා අහනවා ඒ පිළිඳව ක්‍රියාත්මක වෙනවාද මොකද වුණේ කියලා. ඒ සම්බන්ධයෙන් දැන ගන්න අවශායි.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමිය, ඒ සියලු දේවල් අදාල විෂය නිලධාරීන්ට දෙන්නේ. එම නිලධාරීන් හරහා තමා ස්ථානීය පරීක්ෂණය කරන්නේ. ඔබතුමිය සියයට පන්සියයක් විශ්වාස කරන්න ඒ නිලධාරීන්ට අදාල ආධාරය දිය යුතු පුද්ගලයා තෝරා ගැනීම සඳහා අවස්ථාව දෙනවා මිසක් මම ඉල්ලීමක් කරලා තියනවා පක්ෂ විපක්ෂ කිසිම දෙයක් සොයන්න එපා කියලා. නමුත් ආධාරය දෙන කෙනා එම ප්‍රතිලාභය ලැබීමට සුදුසු පුද්ගලයෙක්ද යන වග තෝරා ගන්න. මට අවශා එපමණයි කියලා නිලධාරීන්ට කියලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**
ගරු සභාපතිතුමා, එහෙම ප්‍රශ්නයක් නැහැ. එතන අඩුපාඩුවක් තියේද ඒක මොකක්ද කියලයි අහන්නේ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමිය, ඒවාට දේශපාලනය ගැව්ලාවත් නැහැ. නිලධාරීන්ට විනිවිදබාවයෙන් කටයුතු කරන්න කියලා උපදෙස් දීලා තියෙන්නේ.

අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ඡා කළ යුතු කරුණු අවසන්, ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක්රැස් වූ ගරු උපසභාපතිතුමිය ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියළු නිලධාරීන්ටත් ස්තූතිය පල කරන අතර අද දිනට නියමිත මහා සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 11.30ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

ඉහත සඳහන් වාර්තාව 2025.10.09 දින පැවති මහ සභාවේදී ස්ථිර කරන ලද බව සහතික කරමි.

2025.10.09
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.